# සටහන

2017 සැප් - ඔක් 9 - 10 කලාපය




2 වියට්නාමයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්වීමේ වගකීම

16 ගෙවුම් තුලන ලේඛනය (BPM6)



ISSN 1391-3697


රු. 20/-

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# වියට්නාමය

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...






| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය<br>ගොඩ බිම් ප්‍රමාණය<br>අභ්‍යන්තර ජලාශ | <br>වර්ග කි.මී. 331,210<br>වර්ග කි.මී. 310,070<br>වර්ග කි.මී. 21,140 |
| ජනගහනය (2017 ජූලි ඇස්තමේන්තු) | 96,160,163 |
| ජනගහන වර්ධන වේගය (2017 ඇස්තමේන්තු) | 0.93% |
| උපත් අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 15.5 |
| මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 5.9 |
| උපතේදී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2017 ඇස්තමේන්තු) | 73.7 |
| ළදරු මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (සජීවී උපත් දහසකට) | 17.3 |
| සේවා වියුක්තිය (2016 ඇස්තමේන්තු) | 2.3% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2008) | 37.6 |
| ශ්‍රම බලකාය (2016 ඇස්තමේන්තු) | මිලියන 55.93 |
| දළ දේශීය නිෂ්පාදිතය (2016 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් මිලියන 595.4 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2016 ඇස්තමේන්තු) | 6.2% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2016 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 6,400 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2016 ඇස්තමේන්තු) | |
| කෘෂිකර්මය | 16.3% |
| කර්මාන්ත | 32.7% |
| සේවා | 40.9% |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (2016 ඇස්තමේන්තු) | -5.6% |
| උද්ධමන අනුපාතය (2016 ඇස්තමේන්තු) | 2.7% |
| ආනයන (2016 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 176.6 |
| ආනයන භාණ්ඩ | ඇඳුම්, සපත්තු, ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ, මුහුදු ආහාර, බොරතෙල්, කොපි, ලී භාණ්ඩ, යන්ත්‍රෝපකරණ |
| අපනයන (2016 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් මිලියන 162.6 |
| අපනයන භාණ්ඩ | යන්ත්‍රෝපකරණ සහ උපකරණ පෙට්‍රෝලියම් නිෂ්පාදන, යකඩ නිෂ්පාදන, රෙදිපිළි සහ සපත්තු කර්මාන්ත සඳහා අමු ද්‍රව්‍ය, ඉලෙක්ට්‍රොනික භාණ්ඩ, ප්ලාස්ටික්, මෝටර් රථ |

නිවැරදි කිරීම : පසුගිය සටහන කලාපයේ පළවූ "භූතානයේ සමාජ ආර්ථික තොරතුරු" යටතේ මුළු භූමි ප්‍රමාණය වර්ග කි.මී. 160ක් සේ මුද්‍රණය වී ඇත. එය වර්ග කි.මී. 38,394 වශයෙන් නිවැරදි විය යුතුය.

## වියට්නාමය

වියට්නාමය අධික ජනගහනයකින් යුතු සංවර්ධනය වෙමින් පවතින අග්නිදිග ආසියානු රටක්. එහි තිබූ කෘෂිකාර්මික ආර්ථිකය 1986 සිට කාර්මික හා වෙළෙඳපොළ ආර්ථිකයකට සංක්‍රමණය වෙමින් පවතිනවා. ඒ නිසා, පසුගිය තිස් වසර තුළ වියට්නාමය ලබා තිබෙන සංවර්ධනය විශිෂ්ටයි. ලෝකයේ වේගවත් ම ආර්ථික වර්ධනයක් පෙන්වන රටවල් අතරට 1990 සිට වියට්නාමයත් අයත් වෙනවා. එම කාලය තුළ දරිද්‍රතාව සැලකිය යුතු ලෙස පහළ ගිහින්. පසුගිය වසර දෙකේ දී මිලියන 40කට වැඩි පිරිසක් දරිද්‍රතාවෙන් මිදිලා. අද වියට්නාමයේ සිටින්නේ උගත්, නිරෝගීමත් ජනතාවක්. ග්‍රාමීය මට්ටමෙනුත් සනීපාරක්ෂක හා පානීය ජල පහසුකම් ඉහළ ගිහින්. නමුත් සංවර්ධනයේ දී විශාල අභියෝගවලට වියට්නාමය මුහුණ දෙනවා. ශ්‍රම බලකායේ වර්ධනය මන්දගාමීයි. මධ්‍යම පංතිය ප්‍රසාරණය කිරීමට මෙන් ම බලශක්ති, ප්‍රවාහන, විදුලි සංදේශ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හිඟයි. 2017 වසරේ සිට වියට්නාමය නව්‍යකරණය, ආහාර ආරක්ෂණය හා දේශගුණික විපර්යාස යන ක්ෂේත්‍රවලට ප්‍රමුඛතාව දෙනවා.

මූලාශ්‍ර:

**The World Factbook**
*https://www.cia.gov/library/publications/the-world-factbook/*

**Wikipedia**
*https://en.wikipedia.org/wiki/Vietnam*

**මෙම කලාපයේ ලිපි සමාලෝචනය**
ඩී. කේ. විජේසූරිය මයා - අතිරේක අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය

සටහන

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

# මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්වීමේ වගකීම

**ඩබ්. එම්. ප්‍රියංකර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව

## පසුබිම

දෛනික කටයුතු සිදුකිරීමේ දී ඔබට අවශ්‍ය වන මුදල් ඔබගේ මුදල් පසුම්බියේ සුරක්ෂිතව තබා ගන්නා ඔබ ඊට අතිරේක වූ වැඩිපුර මුදලක් තිබේ නම් ඒවා මූල්‍ය ආයතන තුළ හෝ වෙනයම් තැනක සුරක්ෂිතව තැන්පත් කිරීමක් හෝ යම් කිසි ආයෝජනයක හෝ යොදවනු ඇත. මේ කිනම් ආකාරයට හෝ ඔබ සතු ඔබගේ මෙම මුදල් නීත්‍යානුකුලද? නැතහොත් සාමාන්‍ය ව්‍යවහාරයේ පරිදි මෙම මුදල් පිරිසිදු ද? ඒවා ඔබට රිසිසේ භාවිත කිරීමට නීත්‍යානුකුල හැකියාවක් පවතී ද? සැබැවින්ම සමාජයේ සෑම කෙනෙකු විසින් ම තම හෘදසාක්ෂියට කතාකර ඇසිය යුතු කරුණකි.

භෞතික ලෙස සලකතොත් මේ සෑම මුදලක් ම පිරිසිදු විය හැකි නමුත් මෙම මුදල් ඉපැයූ ආකාරය හඳුනාගත නොහැකි නම්, මෙම මුදල් වියදම් කිරීමට නියමිත කරුණු වසන් කිරීමට යෝජිත නම්, ආර්ථිකයේ මුදල් සැපයීම තුළ මෙම මුදල හඳුනාගත නොහැකි නම් මෙම මුදල් නීත්‍යානුකුලව උපයාගත් මුදල් ලෙස සැලකිය නොහැක. එනම්, සාමාන්‍ය ව්‍යවහාරයේ දී එය අපිරිසිදු මුදල් නැතහොත් "කළු සල්ලි" ලෙස හඳුන්වනු ලබයි. ඔබ සතු මුදල් ඔබගේ රැකියාවෙන් හෝ ව්‍යාපාරයෙන් ඉපැයූ මුදලක් නම්, එම මුදල් ඔබ වියදම් කිරීමට බලාපොරොත්තු වන්නේ ඔබගේ එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා සඳහා ගත් වෙනයම් නීතිමය මුදල් හුවමාරුවකට නම්, ඔබගේ මෙම මුදල් ඉපැයීමට අදාළ බදු මුදල් ඔබ ගෙවා ඇත්නම්, ඔබ සතු මුදල නීත්‍යානුකුල වේ. එනම්, සාමාන්‍ය ව්‍යවහාරයේ දී එය හොඳ පිරිසිදු මුදලක් නැතහොත් "සුදු සල්ලි" වේ.

වර්තමාන සමාජයේ මත් ද්‍රව්‍ය ප්‍රවාහනය, ආයුධ වෙළෙඳාම, බලහත්කාර මුදල් පැහැර ගැනීම්, කප්පම් ගැනීම් වැනි නීති විරෝධී මුදල් ඉපැයීම් ද වංචා හා දූෂණ කටයුතු, නීති විරෝධී කොමිස් ගැනීම් වැනි ක්‍රමවලින් ද උපයා ගනු ලබන මෙම කළු සල්ලි සමාජය තුළට යවා විවිධ කොටස් අතරට යොමු කර වෙනත් වත්කම් ලබා ගනිමින් සුදු සල්ලි බවට පත්කිරීම යනු "මුදල් විශුද්ධිකරණය" වශයෙන් සරලව හැඳින්විය හැකිය. එනම්, නීති විරෝධී කටයුතුවලින් කිලිටි වූ අපිරිසිදු කළු සල්ලි නීතිමය කටයුතු සඳහා යොදා ගැනීමට හැකි වන ලෙසට ආර්ථිකය තුළට මුදා හැර ආදායම් ප්‍රභවය හඳුනාගත නොහැකි වන සේ හිමිකම් හුවමාරු කරමින් මුදල් නීතිමය තත්ත්වයට ගෙන ඒමට පිරිසිදු කර ගැනීම හා එමගින් පිරිසිදු මුදල් ඇති කරගැනීම "මුදල් විශුද්ධිකරණය" යි.

එනම්, මුදල් විශුද්ධිකරණය යනු අපරාධකරුවන් විසින් තම අපරාධමය ක්‍රියාවලින් උපයාගනු ලබන මුදල්, දේපළ හෙවත් උත්පාදනවල මූලික ප්‍රභවය හා නියම අයිතිය සැඟවීම හෝ සංකීර්ණ කිරීම මගින් නීත්‍යානුකුලව උපයාගත් මුදල් හෝ දේපළ බවට පරිවර්තනය කර ගැනීමේ ක්‍රියාවලිය යි. මෙහිදී අපරාධමය ක්‍රියාවලීන් ලෙසට ප්‍රමුඛව සලකනු ලබන ක්‍රියාකාරකම් රාශියකි.

**මුදල් විශුද්ධිකරණයේ දී සලකනු ලබන අපරාධමය ක්‍රියාවලීන්** -

- සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් සහ කූට ජාවාරම් සඳහා සහභාගී වීම
- ත්‍රස්තවාදී කටයුතු සඳහා මුදල් යෙදවීම
- මිනිස් ජාවාරම හා සංක්‍රමණික අවහරණය
- දරුවන්ගේ ලිංගික සූරාකෑම ඇතුළු ලිංගික අපයෝජනය/සූරාකෑම
- මාදක මත්ද්‍රව්‍යය, ඖෂධ සහ මනෝ ක්‍රියාකාරී මත්ද්‍රව්‍යය නීති විරෝධී ජාවාරම
- හොර අවි ආයුධ ජාවාරම
- සොරකම් කරන ලද හා අනෙකුත් භාණ්ඩ ජාවාරම
- දූෂණය හා අල්ලස් ගැනීම
- වංචා කිරීම
- මුදල් ව්‍යාජානුකරණය
- නිමැවුම් සොරකම් කිරීම හා ව්‍යාජානුකරණය
- පාරිසරික නීති උල්ලංඝනය කිරීම
- මිනීමැරුම් හා බරපතළ ශාරීරික තුවාල සිදුකිරීම
- පැහැරගෙන යෑම, නීතිවිරෝධී බාධාකිරීම් හා ප්‍රාණ ඇපකරුවන් සේ තබාගැනීම
- මංකොල්ලකෑම හා සොරකම
- රේගු බදු, සුරාබදු, තීරු බදු හා අනෙකුත් බදු බලපාන්නා වූ හොරබඩු ජාවාරම
- ඍජු බදු හා වක්‍ර බදු සම්බන්ධ වන්නා වූ බදු අපරාධ
- බලෙන් මුදල් පැහැර ගැනීම
- ව්‍යාජ ලේඛන සෑදීම
- අභ්‍යන්තරික රහස් දැනගෙන කරනු ලබන වෙළෙඳාම හා වෙළෙඳපොළ බලාත්මක ලෙස හැසිරවීම

**ත්‍රස්තවාදීනට මුදල් සැපයීම** යනු කිසියම් මාර්ගයකින්, කෙලින් ම හෝ අන්‍යාකාරයෙන් නීති විරෝධී ලෙස සහ හිතාමතා ම ත්‍රස්තවාදීන්ට හෝ එහි අනුගාමිකයන්ට හෝ ත්‍රස්තවාදී ක්‍රියාවල නියුතු වන්නන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානවලට, ඔවුන් උනන්දු කරවීම හා සැලසුම් කිරීම හා එහි නියුක්ත වීමට අවශ්‍ය මූල්‍යමය ආධාර හෝ කුමන වර්ගයේ හෝ ආධාර උපකාර අරමුදල් සැපයීම හෝ එකතු කිරීමයි.

## ජාත්‍යන්තර බලපෑම -

1980 ගණන්වල දී ලෝකයේ මත් ද්‍රව්‍ය වෙළඳාම හා ප්‍රවාහනය ප්‍රචලිත වීමත් සමඟ ම මෙම මුදල් විශුද්ධිකරණය පිළිබඳ වැඩිදුරටත් සැලකිල්ල භාජන විය. මීට පසු වකවානුවල එනම් 1989 හා 1993 වන විට මෙම නීති විරෝධී ක්‍රම ඇති වෙමින් එමගින් මුදල් ඉපැයීම සිදුවීමත් නිසා මෙම මුදල් විශුද්ධිකරණය තව තවත් සංකීර්ණ තත්ත්වයට පත්විය. 2001 සැප්තැම්බර් මස 11 වන දින ඇමරිකාවේ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයට කළ පහර දීමත් සමඟ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම ද මුදල් විශුද්ධිකරණයේ තවත් පැතිකඩක් බවට හඳුනා ගැනිණි. මේ නිසා ජාත්‍යන්තර මට්ටමෙන් මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම් වැළැක්වීමට සම්මුතීන් ඇති වෙමින් ජාත්‍යන්තර නීති රීති නව මගකින් ක්‍රියාත්මක කිරීම ඇරඹිනි.

ගෝලීයකරණ ආර්ථිකයක් හමුවේ අප දැන් "ගෝලීය නිවසක්" යන තත්ත්වයට පත්ව ඇත. මේ නිසා ජාතික ආර්ථිකයන් නිදහස් වෙමින් රෙගුලාසිවලින් තොර ආර්ථික රටාවක් බවට පත්වෙමින් පවතී. ඔබට නිවසේ සිට ලෝකයේ ඕනෑම තැනකට මුදල් හෝ භාණ්ඩ යැවීමටත්, ලෝකයේ ඕනෑම තැනකින් මුදල් හෝ භාණ්ඩ ගෙන්වා ගැනීමටත් හැකි වී තිබෙන්නේ මෙම නිදහස් ආර්ථික තත්ත්වය සහ තාක්ෂණික දියුණුව නිසාවෙනි. මෙනිසා ඉතා ශීඝ්‍ර ලෙස මූල්‍ය තොරතුරුවල සංවර්ධනයක් ඇති වූ අතර, තාක්ෂණයේ හා සන්නිවේදනයෙහි ද ගුණනාත්මක (Exponential) වර්ධනයක් ද සිදුවිය. මේ නිසා ඉතා වේගයෙන් හා පහසුවෙන් ලෝකයේ ඕනෑම තැනකට සංචරණය වීමට හැකියාවක් ද ලැබිණි. මේ සමඟ ම සංවිධානාත්මක අපරාධ සහ ඒ තුළින් වත්කම් ඉපැයීම වර්ධනය විය.

මේ ආකාරයට නව තාක්ෂණික ක්‍රම නිසා මුදල් හුවමාරු ක්‍රම හා ඒවායේ ක්‍රියාකාරීත්වය ඉහළ ගිය අතර එමගින් මූල්‍ය වෙළෙඳපොළේ අවදානම ද වැඩි විය. මෙම අවදානම විශේෂයෙන් අපරාධ හා අපරාධ

නීති උල්ලංඝනය කිරීම ඔස්සේ ඇති වූ අතර එය නීති විරෝධී මුදල් ඉපැයීම් ලෙස පෙන්නුම් කෙරේ. මෙම සංවිධානාත්මක අපරාධ සිදුවීමත් සමග ම ඇති වන්නේ එමගින් ඉපැයූ මුදල්, විශුද්ධිකරණය සඳහා ඔවුන් දරන තැතයි. මෙම සංවිධානාත්මක අපරාධ කල්ලි සහමුලින් ම නැති කිරීමටත්, ඔවුන්ගේ කටයුතු තම තමන්ගේ රටවල් තුළ සිදු නොවීමටත් හා එවැනි දෑ තම රටවල දේශ සීමා හරහා සිදු නොවීමටත් කටයුතු කිරීම මගින් එම නීතිවිරෝධී මුදල් විශුද්ධිකරණය නවතා දැමිය හැක.

මෙවැනි නීති විරෝධී මුදල් විශුද්ධිකරණය වන ප්‍රමාණය කෙතෙක් දැයි සංඛ්‍යාත්මකව කිව නොහැක. උදාහරණයක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 1995 දී ලෝකයේ මුදල් විශුද්ධිකරණය වන මුදල් ප්‍රමාණය ලෝකයේ දල ජාතික නිෂ්පාදිතයෙන් 2.5% අතර අගයක් වන බව ප්‍රකාශ කර ඇත. මෙය වර්තමානයේ නම් එක්සත් ජනපද ඩොලර් බිලියන 800 ත් ට්‍රිලියන 2 ත් අතර අගයක් වේ[1].

### මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය -

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්වීමට උනන්දු වන සැම දෙනෙකු ම එය සිදුකරනු ලබන ආකාරය පිළිබඳව දැනුවත් විම ඉතා වැදගත්වේ. මෙහි දී ප්‍රථමයෙන් ම මුදල් විශුද්ධිකරණය සිදුකරන ආකාරය පිළිබඳව සලකා බලමු.

මුදල් විශුද්ධිකරණයේ ක්‍රියාවලිය අදියර තුනකින් පැහැදිලි කළ හැක. එනම්,

1. **ස්ථාපනය (Placement)** -

   නීත්‍යානුකූල නොවන ආකාරයට උපයා ගත් මුදල්/ දේපළ මූල්‍ය ආයතන හෝ මූල්‍ය නොවන ආයතනවල තැන්පත් කිරීම


2. **ඇතිරීම (Layering)** -

   ස්ථාපිත තැන්පතුවේ ආරම්භය සොයා ගැනීමට අපහසුවන පරිදි ගනුදෙනු හෝ හුවමාරු කිරීම් විශාල ප්‍රමාණයක් සිදුකිරීම

3. **සංකලනය (Integration)** -

   අතුරන ලද මුදල්/ වත්කම්වලින් පිරිසිදු නීත්‍යානුකූල වත්කම් මිලදී ගනිමින් නීතිමය තත්ත්වයක් ලබාදීම

ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේදී මෙම ක්‍රියාවලියේ අනුපිළිවෙළ ප්‍රතිවිරුද්ධ ආකාරයට සිදුවන බව අවබෝධ කරගත හැකිය. (රූප සටහන බලන්න)




නීති විරෝධී ආකාරයට උපයා ගන්නා ලද මුදල් තොග ලෙස නීතිමය මුදල් මාර්ගයට එක් කිරීම හෙවත් ස්ථාපනය (Placement) ප්‍රථම පියවර ලෙස සිදු කරනු ලබයි. මෙය කළු සල්ලි නීතිමය තත්ත්වයට පත්කිරීමයි. මෙමගින් මුදල් නව ස්ථානයකට පත්වන අතර මුල් අයිතියෙන් මිදී නීතිමය මුදල් ධාරාවට එක් වෙයි. මෙහි දී නව බැංකු ගිණුම් ඇරඹීම අයිතිකරු හඳුනාගත නොහැකි වන පරිදි සිදු කරන අතර නැතහොත් පවත්වාගෙන යනු ලබන ගිණුම්වලට තෙවන පාර්ශ්වයක් ලවා මුදල් තැන්පත් කරවීම සිදු කරයි. බොහෝවිට මෙම කාරණයේ යෙදෙන්නන් මුදල් අවහරණ උපාය ක්‍රම (Smurfing Techniques) භාවිත කරමින් තැන්පතු කුඩා කොටස්වලට වෙන් කරමින් තැන්පත් කිරීම දැකිය හැකිය. මෙමගින් ඔවුන් මූල්‍ය ආයතන තුළ මුදල් තැන්පත් කිරීමේ දී ඇතිවන මුදල්වල ප්‍රභවය පිළිබඳ සැකය මග හැරීමට උත්සාහ කරයි.

මෙසේ තැන්පත් කරන ලද නීති විරෝධී මුදල් දෙවන අවස්ථාවේ දී අයිතිය නොහැගෙවෙන ලෙස විවිධ තැන්පත් ස්ථාන/ උපකරණවල යොදවනු ලැබීමට අවශ්‍ය ලෙස ඇතිරීම (Layering) සිදු කෙරේ. මේ නිසා මෙම මුදල්වල ආරම්භය සොයාගත නොහැකි වන ආකාරයට මුදල් හුවමාරු කිරීමක් සිදු වේ. මෙහි දී මූල්‍ය පද්ධතිය තුළ මුදල් එහා මෙහා කිරීම ඉතා කෙටි

1. The Financial Action Task Force (FATF) මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය http://www.fatf-gafi.org

කලක් තුළදී සිදුවීම නිසා අධිකරණ මූල්‍ය විමර්ශකයන් පවා මුළාවට පත්වීම සිදු වේ. දිගින් දිගටම මෙම ක්‍රියාව දැකීම නිසා ඔවුන් ද මෙම මුදල් නීත්‍යානුකූල මුදල් ලෙස වරදවා වටහා ගනී. මේ ආකාරයට විවිධ ස්ථරවල මුදල් යෙදවීම නිසා මුදල් ප්‍රභවය තේරුම් ගැනීම අපහසු කරවයි. මෙහි දී සමහර විට ඉතා වටිනා අයිතමයන් එනම් ස්වර්ණාභරණ, යාන වාහන මිලදී ගැනීමට මෙම මුදල් යෙදවීමත් නැවත ඒවා විකුණා තැන්පතුවල දැමීමත් සිදු කරයි. හදිසි මුදල් අවශ්‍යතාවකට උකස් කර තබා ඇති රන් ආභරණ සින්න වීමට යන අවස්ථාවේ දී ඒ අයට තම කළු සල්ලි ලබා දී ඒවා බේරාගෙන එම රන් භාණ්ඩ ලබා ගැනීමද තම මුදල් ප්‍රභවය සඟවා ගැනීමේ ප්‍රකට ක්‍රමයකි.

අවසාන ලෙස හෙවත් තෙවනුව මේ ආකාරයට විවිධ ස්ථරවල තිබූ මුදල් ඔවුනට අවශ්‍ය ආකාරයට ඒකරාශී කර එනම්, සංකලනය (Integration) කර එම මුදල් යොදා ආර්ථිකය තුළ තමාට අවශ්‍ය දෑ මිල දී ගැනීම කරයි. මෙහි දී මූල්‍ය පද්ධතිය තුළ මෙම මුදල්වල ප්‍රභවය පිළිබඳව කිසිම සැකයක් ඇති වන්නේ නැත. ඒ මන්ද සියලු ම මුදල් ලබාගනු ලබන්නේ මූල්‍ය ක්‍රමය තුළ පවතින මුදල්වලින් බැවිනි. මෙහිදී මෙම මුදල් බොහෝවිට මිල අධික දෑ මිල දී ගැනීමට යොදවනු ලබන අතර සමාගම්වල කොටස් මිල දී ගැනීමකට, ඉඩකඩම් මිලදී ගැනීමකට හෝ තමා නමින් වෙනත් නීත්‍යානුකූල ව්‍යාපාර ආරම්භ කිරීම වැනි දෑට යොමු කරයි. මෙසේ කළු සල්ලි උපයන්නන් බොහෝ විට තැන් තැන්වල ඉඩකඩම් මිල දී ගැනීම, වාහන විකුණුම් මධ්‍යස්ථාන ඇරඹීම හෝ ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය - ලෝහ භාණ්ඩ විකුණුම් ස්ථාන වැනි දෑ ඇරඹීම ඔබට දැකිය හැකි වනුයේ මේ නිසාය.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ දී සිදුවන්නේ මෙහි විරුද්ධ ක්‍රියාවලිය යි. එනම් නීත්‍යානුකූලව උපයා ඇති මුදලින් ගත් දේපළ ප්‍රථමයෙන් ඒකරාශී කිරීම හෙවත් සංකලනය කිරීම සිදුකරනු ලබයි. මෙසේ එක් කරන ලද මුදල් විවිධ මූල්‍ය ආයතනවල ගිණුම්වලට හුවමාරු කරමින් ප්‍රභවය හඳුනා ගත හැකි වන ලෙස හුවමාරු කරයි. මෙය ඇතිරීම හෙවත් එකතු කරන ලද තැන්පතුවේ ආරම්භය සොයා ගැනීමට අපහසුවන පරිදි ගනුදෙනු හෝ හුවමාරු කිරීම් විශාල ප්‍රමාණයක් කිරීම ලෙස හඳුනාගත හැක.

අවසානයේ අදාළ ගිණුම්වලට කෙලින් ම මුදල් තැන්පත් කරමින් ත්‍රස්තවාදීන්ට අවශ්‍ය ආයුධ, බෙහෙත්, උපකරණ ආදිය මිල දී ගැනීම කරනු ලබයි. මෙය ස්ථාපනය හෙවත් නීත්‍යානුකූල ලෙස උපයා ගත් මුදල්/ දේපළ මූල්‍ය ආයතන හෝ මූල්‍ය නොවන ආයතනවල තැන්පත් කිරීම තුළින් නීත්‍යානුකූල නොවන ත්‍රස්තවාදී ක්‍රියා සඳහා යෙදවීමයි.

මුදල් විශුද්ධිකරණය කරන අවස්ථා පිළිබඳ දැනුවත් වූ ඔබ ඔවුන් මෙසේ කරන්නේ කුමක් අරබයා ද යන්න පිළිබඳව දැනුවත් විය යුතුය.

## මුදල් විශුද්ධිකරණයේ පරමාර්ථ -

මුදල් විශුද්ධිකරණයේ මූලික ම පරමාර්ථය වනුයේ තම නීති විරෝධී මුදල්වල අයිතිය සඟවමින් මූල්‍ය ක්‍රමය තුළ තම මුදල් මුදාහැරීම හා එමගින් තමා සතු වත්කම් නීතිමය මුදල් බවට පත්කර ගැනීම යි. මෙහි දී මොවුන් හැකි සෑම විට ම සැකයක් ඇති නොවන පරිදි මුදල් සංකීර්ණ හුවමාරු කිරීමේ ක්‍රියාවලියකට භාජන කරයි. හැකි නම් මෙම මුදල් විවිධ රටවල්වලට ද හුවමාරු කර විටින් විට නැවත ගෙන්වා ගැනීම මගින් මුදලේ නීත්‍යානුකූලභාවය ඇති කිරීමට උත්සාහ කරයි.

මේ ආකාරයට මුදල් විශුද්ධිකරණයේ දී ප්‍රථමයෙන් නීති විරෝධී ලෙස උපයා ගන්නා ලද මුදල් සැඟවීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. දෙවනුව ඔවුන් විසින් සිදුකරනු ලබන්නේ මෙම මුදල් සංචලනය කිරීම යි. මේ තුළින් අපරාධය හා මුදල්ද, අපරාධකරුවා හා මුදල් ද අතර සම්බන්ධය සොයා ගත නොහැකි වන ලෙසට අවුල් සහගත තත්ත්වයකට පත් කිරීම සිදු කරයි. අවසානයේ ඔවුන් එම මුදල් ආයෝජනයට යොමු කිරීම මගින් නීත්‍යානුකූල නොවන ආකාරයට උපයාගත් මුදල්වලට නීතිමය තත්ත්වයක් ලබා දේ.

## මුදල් විශුද්ධිකරණයේ යෙදෙන මොවුන් කවුරුන් ද?

මත් ද්‍රව්‍ය වෙළෙඳාමේ යෙදෙන්නන් විශේෂයෙන් ඉහත දැක්වූ ක්‍රම ඇසුරින් තම නීති විරෝධී ආදායම විශුද්ධිකරණයට ලක් කරනු ලබයි. මොවුන්ගේ වැඩිමනත් ගනුදෙනු මුදල් නෝට්ටුවලින් ම සිදු වීම නිසා විශුද්ධිකරණයේ ඉව පාර (Trail) මකා දැමීමට කටයුතු කරයි.

යමෙක් විශාල ප්‍රමාණවලින් මුදල් නෝට්ටු ගනුදෙනු සඳහා පරිහරණය කරන්නේ නම්, ඔවුන් පිළිබඳව මුදල් විශුද්ධිකරණය හා සම්බන්ධයක් ඇත්දැයි පරීක්ෂාකාරී විය යුතු ය.

විශේෂයෙන් අපරාධකරුවන් සහ පාතාල කල්ලි සාමාජිකයන් ගනුදෙනු සිදුකරනුයේ මුදල් නෝට්ටු

වලිනි. මෙම ගනුදෙනු බොහොමක් ආරක්ෂාකාරී ලෙස තම අපරාධ කල්ලි ජාල හරහා නෝට්ටුවලින් දේශීයව මෙන්ම ජාත්‍යන්තරව බෙදා හැරීම ද සිදු කෙරේ.

නීති විරෝධී ව්‍යාපාරිකයින්, වංචාකාරී පුද්ගලයින් හා දූෂිත දේශපාලනඥයින් ද තම බොහොමයක් ගනුදෙනු සඳහා මුදල් නෝට්ටු යොදා ගනී. මේ නිසා අනවශ්‍ය ලෙස සිදුකෙරෙන විශාල නෝට්ටුමය ගනුදෙනු පරීක්ෂා කර බැලිය යුතු වේ. දූෂිත රාජ්‍ය නිලධාරීන් පවා ගෙවීම් කටයුතුවල දී ගනුදෙනු මුදල් නෝට්ටු මගින් ම සිදු කරයි. මේ නිසා, මාසික වැටුප් ලබන්නන් ද නිරන්තරයෙන් මුදල් නෝට්ටු විශාල ප්‍රමාණවලින් හුවමාරු කරන්නේ නම් ඒ පිළිබඳව ද පරීක්ෂාකාරි විය යුතුය.

අද සමාජයේ බහුලව දක්නට ලැබෙන මුදල් වංචාකාරයින් ද ඔවුන්ගේ ගනුදෙනු බොහොමයක් ම මුදල් නෝට්ටු යොදා ගෙන සිදු කරන්නේ අදාළ ඉව පාර වසා දැමිය හැකි පරිදි අදාළ සාක්ෂි සංචලනය මගිනි. මේ නිසා මුදල් විශුද්ධිකරණයේ යෙදෙන්නන් කවුරුන්ද යන්න හොඳින් හඳුනාගත යුතු වේ. එසේම ත්‍රස්තවාදී වැඩකටයුතුවල නියැලෙන්නන් ද තම ආයුධ හා පුපුරන ද්‍රව්‍ය සඳහා මුදල් එකතු කරන්නේ මෙවැනි ම ආකාරයට මුදල් ගලා යන මාර්ගය හඳුනාගත නොහැකි වන පරිදි ය.

## මුදල් විශුද්ධිකරණය ඇතිවන්නේ ඇයි?

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා අවශ්‍ය නීතිරීති ඇතත් ඒවා නියම ආකාරයට ක්‍රියාත්මක නොවන්නේ නම් එම රට තුළ මුදල් විශුද්ධිකරණය සිදුවනු දැකිය හැක. මේ නිසා සෑම මූල්‍යමය ගනුදෙනුවක් සඳහා ම සුදුසු නීතිමය කටයුතු සිදුකර තිබීම අනිවාර්ය වේ.

බදු ගෙවීම් මග හැරීම සඳහා මිනිසුන් තම ආදායම් සඟවා තබා ගනිති. මේ නිසා ද ඔවුන්ගේ ආදායම නීති විරෝධී ආදායමක් බවට පත්වේ. එවිට ද ඔවුන් මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය කරා තම මුදල් යොදවනු ලබයි. මේ නිසා ද මුදල් විශුද්ධිකරණයක් ඇති විය හැක.

එසේම, තම ලාභය වැඩිකර ගැනීම සඳහා ද ව්‍යාපාරිකයන් මුදල් විශුද්ධිකරණයට යොමුවේ. මේ සඳහා ඔවුන් ප්‍රචාරණය කරණු ලබන්නේ තම ගනුදෙනු කරුවන්ගේ පහසුව සඳහා ඉතා ම අල්ප ප්‍රමාණයක් තොරතුරු ලබා ගන්නා බවත් එම තොරතුරු ඉතා රහසිගතව තබාගන්නා බවත්ය. මේ නිසා නීතිමය ආකාරයෙන් මුදල් උපයා ගන්නා නව ගනුදෙනුකරුවන් මෙන්ම, නීතිවිරෝධීව මුදල් උපයා ගනු ලබන තම අනන්‍යතාව සඟවා ගත යුතු ගනුදෙනුකරුවන් ද මෙම ව්‍යාපාර කරා ඇදී එයි. මෙවැනි ආකාරවලට නීත්‍යානුකූල මෙන්ම නීතිවිරෝධීව ඉපැයූ මුදල් ද වැඩි වැඩියෙන් ව්‍යාපාරය තුල ආයෝජනය කර ගැනීම් මගින් මෙවැනි ව්‍යාපාරිකයන්ගේ ලාභය උපරිම වේ. එනම්, ව්‍යාපාරිකයන් තම ලාභ උපරිම කර ගැනීම සඳහා වැඩි අවදානමක් දරමින් මුදල් විශුද්ධිකරණයේ යෙදෙන බවයි.

තම තමන් සතු පෙර උපයාගත් කළු සල්ලි නීතිමය ඒවා බවට පෙන්වා දීම සඳහා ද මුදල් විශුද්ධිකරණයේ යෙදෙන්නන් දැකගත හැකිය. මෙහි දී මොවුන් අඩුම උත්සාහයක් දරා උපරිම ප්‍රමාණයෙන් මෙම කළු සල්ලි සුදු ඒවා බවට පත් කර ගැනීමට උත්සාහ කරයි. අඩු අවදානමක් දරා තම කළු සල්ලි සුදු සල්ලි බවට පත්කර ගැනීමට හැකි වන්නේ නම්, හැකි සෑම විටම ව්‍යාපාරිකයා තව තවත් කළු සල්ලි ඉපැයීමට උත්සාහ කරයි.

මේ ආකාරයට මුදල් විශුද්ධිකරණය කරන්නන් නීතියේ රැහැනට අසුවීමට ඇති අවදානම අධික වූ විට මෙවැනි පුද්ගලයන් මුදල් විශුද්ධිකරණයෙන් ඉවත්වනු ඇත. මේ සඳහා රට තුළ පවතින නීතිමය රාමුව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

## මුදල් විශුද්ධිකරණයේ ආර්ථිකයේ ප්‍රතිවිපාක -

මුදල් විශුද්ධිකරණයේ නියුතු වන්නන් ඔවුනට අවශ්‍ය මූල්‍ය සම්පත් සඟවා ගැනීමට විවිධ ආයෝජනවල එම මුදල් යොදවනු ලබයි. මේ නිසා මෙම බොහොමයක් ආයෝජන රටේ ආර්ථිකයට කිසිසේත් ම වාසි සහගත නොවන ආර්ථික පරිසරයට නොගැළපෙන ආයෝජනයන් වේ. මේ නිසා මොවුන් මෙම ආයෝජන වරින් වර මෙවැනි මාර්ග සඳහා යොමු කරමින් ඵලදායිත්වයෙන් අඩු ආයෝජන ඇති කරයි. මේ නිසා ආර්ථික රටාවේ විරූප වීමක් (Distortion) හා අස්ථායිතාවයක් (Instability) ඇති වේ. එමෙන්ම මුදල් විශුද්ධිකරණය නිසා ඔවුන් තම ආදායම් සඟවා ගැනීමට යෑමෙන් ආර්ථික වර්ධනයට ද හානි සිදුවේ.

මුදල් විශුද්ධිකරණය සඳහා හිතකර වටපිටාවක් ඇති වුවහොත් එම පරිසරයේ අපරාධ හෝ දූෂණ ඉහළ යාමේ ප්‍රවණතාවක් නිතැතින්ම ඇති වේ. මේ නිසා අපරාධකරුවන් ප්‍රමාණය ඉහළ යන අතර ඔවුන්ගේ මුදල් වියදම් කිරීමේ රටාවන් ද වෙනස් වේ. මේ නිසා දූෂණය සඳහා අවශ්‍ය පසුබිම ද සැකසෙන අතර

ආර්ථික රටාවම කණපිට හැරේ. මේ නිසා සමස්ත ආර්ථිකයම බිඳ වැටීමකට ලක්වනු ඇත.

මුදල් විශුද්ධිකරණයේ ගනුදෙනු බොහොමයක් ම පාතාල ගනුදෙනු ඔස්සේ ද සිදුවේ. තවද මෙම ගනුදෙනු බොහොමයක්ම අවිධිමත් අංශය ඔස්සේ සිදුවන නිසා ගනුදෙනු සඳහා මුදල් ලබාගන්නේ නීතිමය නොවන ආකාරයෙනි. මේ නිසා එම මුදල් ගනුදෙනු පිළිබඳ තොරතුරු කිසිවක් නිල සංඛ්‍යාලේඛනවලට ඇතුළත් නොවේ. මේ නිසා අදාළ අංශවලින් ආර්ථිකය පිළිබඳව ලබා දෙන සංඛ්‍යාලේඛනවලින් සමාජය නොමඟ යවන අදහසක් ජනිත වේ. මේ නිසා ආර්ථිකමය ප්‍රතිපත්ති සම්පාදකයන් ද නොමඟ යන අතර ඔවුනගේ උපදෙස් හා පුරෝකථන වැරදි සහගත වේ.

විශුද්ධිකරණයට ලක්වන මුදල් තොරතුරු කිසිවක් නිල වාර්තාවල සඳහන් නොවීම නිසා, කිසිවිටෙකත් ඒවා ආදායම් බදුවලට ලක් නොවේ. මේ නිසා රට තුළ ආර්ථිකයේ බදු ආදායම පහළ යයි. මේ නිසා බදු ගෙවන්නන් පවා මුදල් විශුද්ධිකරණය සඳහා යොමු වීම නිසා තව තවත් බදු ආදායම පහළ යනු ඇත. මෙම විෂම චක්‍රය නිසා ආර්ථික වර්ධනය සඳහා බාධා පැමිණෙනවාක් මෙන්ම රජයේ ආදායම ද අඩු වී යයි. මේ නිසා රාජ්‍ය සේවාවල ද තත්ත්වය හීන වී සමස්ත සංවර්ධනයම ඇන හිටිනු ඇත.

මේ නිසා සම්පත් අවධිමත් බෙදාහැරීමක් ද සිදු වේ. අඩු සම්පත්ධාරීන් හා වැඩි සම්පත්ධාරීන් අතර ඇතිවන තරගය නිසා නීත්‍යානුකූල නොවන ආදායම් ඉපයීම් වැඩිවේ. මෙම අවස්ථාවන් පාලනය කිරීම සඳහා විටින් විට ආර්ථික ප්‍රතිපත්තිද වෙනස් කළ යුතුවේ. මේ අනුව බලනවිට මුදල් විශුද්ධිකරණය නිසා ආර්ථික ප්‍රතිපත්තිවල පාලනය ද ගිලිහී යනු ඇත. එනම්, පාලනයෙන් තොර ආර්ථික ක්‍රමයක් බිහිවනු ඇත.

මුදල් විශුද්ධිකරන්නන් විසින් ඉතා විශාල ප්‍රමාණවලින් මුදල් මූල්‍ය ආයතනවල තැන්පත් කරන අතර තම අවශ්‍යතාව මත එක්වරම එම මුදල් නැවත වරක් ඉවත්කර ගැනීමක් ද සිදු කරයි. මෙම මුදල ඉවත් කර ගැනීම ද සිදුවන්නේ පෙර දැනුම් දීමකින් තොරව නිසා මූල්‍ය ආයතන ද මෙයින් දැඩි අපහසුතාවට පත් වේ. මේ නිසා මූල්‍ය ආයතනවල ද්‍රවශීලතා ගැටලුවකට මුහුණ දීමට සිදු වේ. මේ ආකාරයට මුදල් විශුද්ධිකරණය නිසා මූල්‍ය ආයතන වසා දැමීමට පවා ලක්විය හැක.

ආර්ථික ප්‍රතිසංස්කරණවල දී ගෝලීයකරණය ද මුදල් විශුද්ධිකරණයට හොඳ තෝතැන්නක් ලබා දේ. සංවිධානගත අපරාධකරුවන් විසින් තම නීත්‍යානුකූල නොවන ආකාරයට උපයා ගන්නා ලද මුදල් හරහා රාජ්‍ය ආයතන ද පෞද්ගලීකරණයට යොමු කරයි. ඒ නිසා රාජ්‍ය ආයතන ද තම හිතැඟි පරිදි පාලනය කරමින් නීතිවිරෝධී ක්‍රියා තව තවත් ඉටුකර ගැනීමට මඟ පාදා දෙන අතර මුදල් විශුද්ධිකරණය සඳහා සුදුසු පරිසරයක් සාදා ගනී. මේ නිසා පෞද්ගලීකරණයේ බලපෑම දෙගුණ තෙගුණ කිරීමට මුදල් විශුද්ධිකරණය හේතු පාදක වනු ඇත.

රට තුළ මුදල් විශුද්ධිකරණය සඳහා අවකාශ සාදා දී තිබෙන විට රටේ පිළිගත් මූල්‍ය ආයතනයන් විනාශ වන අතර මේ නිසා ව්‍යාපාරික ප්‍රජාව තුළ ඇති පිළිගැනීම ද නැති වී යයි. මේ නිසා ඇතිවන සෘණාත්මක පිළිගැනීම නිසා ජාත්‍යන්තර මූල්‍යමය අවස්ථා ද හීන වී යන අතර රටේ ආර්ථිකයේ ස්ථාවරත්වය සඳහා ලැබෙන ජාත්‍යන්තර පිළිගැනීම ද හීන වී යයි.

මේ නිසා ජාත්‍යන්තර අපරාධ කල්ලිවල අවධානය ද මේ වෙත එල්ල වේ. එනිසා ඔවුන්ද ආයෝජනයන් සිදුකිරීම සමඟ රටක් ලෙස අප සතු කෙටි කාලීන ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකිවනවාක් මෙන්ම සුහදශීලී පිළිගැනීම ද විනාශ කරයි. එහි ප්‍රතිඵලයක් ලෙසට ආර්ථික වර්ධනයේ හා සංවර්ධනයේ ප්‍රතිඵල ද හීන වී යයි.

පිටස්තරයෙන් ගලා එන ආර්ථික අරමුදල් මගින් මුදල් විශුද්ධිකරණයට ලක්වන්නේ නම් ඒ ආකාරයටම එම අරමුදල් පිටතට ගලා යාම ද සිදු වේ. මේ නිසා රටක් ලෙස අප සතු සංචිත පිටතට ගලා යාමෙන් අප රට ආර්ථික වශයෙන් මහත් දුෂ්කරතාවලට ලක්වීමට සිදු වේ. මේ නිසා නීතිමය ලෙස අප රට වෙත ඇදී එන ඍජු විදේශ ආයෝජනයන්ට (FDI - Foreign Direct Investment) ද බාධා පමුණුවනු ඇත. මේ නිසා සංවර්ධනය වෙමින් පවතින අප වැනි රටවල පවතින ප්‍රාග්ධන හිඟතාව තව තවත් උග්‍ර අතට හැරවීමට මෙම නීතිමය නොවන ප්‍රාග්ධන ගලායෑම් හේතු වේ. එනම් මුදල් විශුද්ධිකරණය සිදුවන්නේ නම් ප්‍රාග්ධන හා වෙළෙඳ ආයෝජන ගැලීම් සඳහා දැඩි විකෘතිභාවයක් ඇති වේ. මෙය දිගුකාලීන ලෙස රටක ආර්ථිකය බිඳ වැටීමට ද හේතු වේ.

### මුදල් විශුද්ධිකරණයේ සමාජයීය බලපෑම -

මුදල් විශුද්ධිකරණය සඳහා පහසුකම් සැලැස්වෙන විට එහි වාසිය ලබාගනු ලබන්නේ මත්ද්‍රව්‍ය බෙදා හරින්නන්, හොර බඩු ජාවාරම්කරුවන් සහ අනෙක් අපරාධකරුවන් වේ. මේ නිසා ඔවුන් තමන්ගේ ආදායම

වැඩිකර ගැනීම සඳහා ක්‍රියාකාරී ජාලයන් වැඩිදියුණු කර ගනී. මේ නිසා අපරාධමය ක්‍රියාවල වැඩිවීමක් ද දක්නට ලැබේ. මේ නිසා මේවා මර්දනය කිරීම සඳහා රජයට නීතිය බලාත්මක කරන ආයතනවලට වැඩිපුර මුදල් වියදම් කරමින් ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීමට සිදුවනු ඇත. එසේම මත්ද්‍රව්‍ය ප්‍රචලිත වීම නිසා එයින් ජනතාව ගලවා ගැනීමට අවශ්‍ය නිවාරණ කටයුතු හා සෞඛ්‍යමය වියදම් සඳහා රජයට අමතර මුදලක් වැය කිරීමට සිදුවනු ඇත. මේ නිසා රජයේ වියදම් පාර්ශ්වය ද ඉහළ යාම නිසා රජය ද මහත් අපහසුතාවට ලක්වේ. මේ නිසා සංවර්ධනය සඳහා යොමුවන අරමුදල් ප්‍රමාණය අඩුවීම නිසා සමස්ත රට තුළ ම සංවර්ධනය ඇනහිටී.

මේ ආකාරයට වෙළෙඳපොළ මත, රජය මත රට වැසියන් තුළ තිබූ ආර්ථික මෙහෙයවන බලය අපරාධකරුවන් අතට හුවමාරු වීමක් සිදු වේ. මේ නිසා ඔවුන් විසින් සමාජය තුළ පවතින සෑම ක්‍රියාවක්ම දූෂණයට ලක් කරනු ඇත. මේ නිසා සමස්ත සමාජයම හැසිරවීමට එම අපරාධ කල්ලිවලට හැකියාවක් ඇති වන අතර මහජනයාගේ විශ්වාසය ද බිඳ වැටී යයි. මේ නිසා මහජනතාව නීතිය පිළිබඳ තැකීමක් නොකරන අතර නීති විරෝධී ක්‍රියා බහුල වේ. නීතිමය වශයෙන් පත්වූ රජයක් පැවතිය ද මෙම අපරාධ කල්ලි මගින් රට පාලනය කරන තත්ත්වයට මේ නිසා රට පත් වේ.

මෙම අපරාධ කල්ලිවල ඉහළ ක්‍රියාකාරීත්වය හා ආදායම් ප්‍රමාණ ඉහළ යන විට ඔවුන් ආර්ථිකමය හා දේශපාලනමය බලපෑම් සිදුකරන තත්ත්වයට හැඩ ගැසේ. මේ නිසා සමාජයේ පවතින සමස්ත නිර්මාණයට ද, සාමූහික මානුෂීය සම්මුතීන්වලට ද අවසානයේ සමස්ත සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී තත්ත්වයට ද හානිකර වනු ඇත.

### මුදල් විශුද්ධිකරණයේ ව්‍යාපාරික බලපෑම -

අපරාධමය ක්‍රියාවලින් උපයාගනු ලබන මුදල් උපක්‍රමශීලීව ඔවුන් විසින් ව්‍යාපාරවල අරමුදල් සඳහා යොදවනු ඇත. මෙහි දී ඔවුන් එම ව්‍යාපාරවල අධ්‍යක්ෂ මණ්ඩලවලට අල්ලස් දීමෙන් හෝ සේවකයන් මත බලපෑම් කිරීමෙන් සේවකයන්ගේ දෑස් වසා තම නීත්‍යානුකූල නොවන ආකාරයට උපයාගත් මුදල් යොදවයි. මේ නිසා මෙම අරමුදල් ප්‍රමාණය ඉහළ යත්ම ව්‍යාපාරයේ පරිපාලනයට ද මෙම අපරාධ කල්ලි හවුල් වේ. මේ නිසා මොවුනගේ මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය පහසුවෙන් ඉටුකර ගැනීමට හැකි වන සේ පරිපාලනය වැඩි ප්‍රතිශතයක් ඔවුන්ගේ නමට හරවා ගනී. මේ නිසා සමාජය පුරාම අදාළ ව්‍යාපාරය ද එම නීති විරෝධී ක්‍රියා ජාලය තවත් එක් ව්‍යාපාරයක් ලෙස හඳුනා ගනී. මේ නිසා ව්‍යාපාරය වගකීම් දරන්නන්ට එනම් කොටස් හිමිකරුවන්ට, සැපයුම්කරුවන්ට, පාරිභෝගිකයන්ට සහ සේවකයන්ට එම ව්‍යාපාරය කෙරෙහි විශ්වාසය බිඳවැටීමක් සිදු වේ. මේ නිසා ක්‍රමක්‍රමයෙන් ව්‍යාපාරයේ මූලික පරමාර්ථය බිඳවැටී මුදල් විශුද්ධිකරණයට පමණක් මුදල් යොදවන එකක් බවට පත්වේ. මේ නිසා අවසානයේ සමස්ත ව්‍යාපාරය ම බිඳ වැටී යයි.

### මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්විය යුත්තේ ඇයි?

ශ්‍රී ලංකාව පසුගිය වසර පහ සඳහා 6% ක සාමාන්‍යය ලෙස ශක්තිමත් දළ දේශීය නිෂ්පාදිතයක් වර්ධනය කර ගැනීමට සමත් වී ඇත. සමස්ත ඉල්ලුමෙන් දේශීය පරිභෝජන ඉල්ලුම විශාල දායකත්වයක් මේ සඳහා ලබාදෙන ලද අතර විදේශයන්ගෙන් ගලා ආ ආයෝජන ද ප්‍රධාන තැනක් ගනී. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය 2016 වසරේ දී එක්සත් ජනපද ඩොලර් 3835 ක ඉහළ අගයක් පෙන්නුම් කරයි. ඉහළ මැදි ආදායම් කාණ්ඩයේ රටක් බවට පත්වෙමින් පවතින ශ්‍රී ලංකාව භූගෝලීය ලෙස ද හොඳ සංධිස්ථානයක පිහිටීම නිසා, දිගු කාලීන උපාය මාර්ගික සහ ව්‍යුහාත්මක සංවර්ධන අභියෝග කෙරෙහි අවධානය යොමු කර ඇත.

මුදල් විශුද්ධිකරණයේ යෙදෙන්නන් හා ත්‍රස්තවාදී කටයුතුවලට සම්බන්ධ වූවන් ඉහත සමාජීය හා ආර්ථික වටපිටාවෙන් ප්‍රයෝජනයට ගනිමින්, තම නීත්‍යානුකූල නොවන ක්‍රමවලින් උපයා ගත් අරමුදල් රට තුළ යෙදවීමටත්, එමගින් එම වත්කම් නීත්‍යානුකූල නොවන ලෙස උපයාගත් බව වසන් කිරීමටත් උත්සාහ කරනු ඇත.

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රමෝපායන් ඇති කිරීම සඳහා සුදුසු වූ නීති පද්ධතියක් හා මූල්‍ය ක්‍රමයක් ශ්‍රී ලංකාවේ පවතී. මූල්‍ය ක්‍රමය තුළ දිනෙන් දින වර්ධනය වන නවීන තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් කෙරෙන බැංකු කටයුතු හා මූල්‍ය කටයුතුවල දී මුදල් විශුද්ධිකරන්නන් හා ත්‍රස්තවාදීන්ට මුදල් සපයන්නන් ද සිටින නිසා ඔවුන් තම අවශ්‍යතාව ඉටුකර ගැනීමට විවිධ උපක්‍රම මගින් මැදිහත් වීමට ඉඩ ඇති හෙයින් ඔවුන්ව වෙන් කර හඳුනා ගැනීම ඉතා වැදගත් කටයුත්තක් බවට පත්වෙමින් පවතී. මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම නිසා ආර්ථිකය තුළ

ඇතිවන ප්‍රතිවිපාකයන් ද, ඒ නිසා ව්‍යාපාරික ප්‍රජාව තුළ ඇතිවන බිඳ වැටීම හා සමස්ත සමාජීය බලපෑම අනුව එය මර්දනය කිරීම හා නැවත සිදුනොවන පරිදි වැළැක්වීම ද ඉතා වැදගත් වේ.

## මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඬලිය හැක්කේ කෙසේ ද?

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය පිහිටුවීමේ මූලික පරමාර්ථය වන්නේද මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඬලීම වේ. ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ බොහෝ රටවල පිහිටුවා ඇති මෙම මූල්‍ය බුද්ධි ඒකක, එකිනෙකා අතර අන්‍යොන්‍ය සබඳතාවන් ඇති කර ගනිමින් ඉතා විශාල නිහඬ සේවයක් ඉටු කරයි.

මුදල් විශුද්ධිකරණයේ ශීඝ්‍ර වර්ධනය හා එහි තර්ජනය සැලකිල්ලට ගෙන එයට ප්‍රතිචාර වශයෙන්, 1989 දී පැරිසියේ පවත්වන ලද G-7 සමුළුව විසින් මුදල් විශුද්ධිකරණය පිළිබඳ මූල්‍ය කාර්ය සාධක බලකාය (Financial Action Task Force on Money Laundering - FATF) ස්ථාපිත කරන ලදී. එහිදී, මුදල් විශුද්ධිකරණය තාක්ෂණික ක්‍රම හා ප්‍රවණතා පරීක්ෂා කිරීමටත්, ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ ඉටුකර ඇති පියවර සමාලෝචනය කිරීමටත් හා තවදුරටත් මුදල් විශුද්ධිකරණයට එරෙහිව සටන් කිරීම සඳහා අවශ්‍ය පියවර සෙවීමේ වගකීමත් මෙම කාර්යය සාධක බලකාය වෙත පවරන ලදි.

ඒ අනුව විටින් විට නවීකරණය කරමින්, FATF මුදල් විශුද්ධිකරණයට එරෙහිව සටන් කිරීමට අවශ්‍ය පියවර හා සැලසුම් ඇතුළත් පුළුල් නිර්දේශ මාලාවක් අඩංගු වාර්තාවක් නිකුත් කර ඇත. 2012 පෙබරවාරි මස දී, FATF එහි ප්‍රමිතීන් ගැඹුරු සමාලෝචනයකට ලක් කොට සංශෝධිත FATF නිර්දේශ හතලිහක් ප්‍රකාශයට පත්කර ඇත.

ශ්‍රී ලංකාව තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නම් කරන ලද ආයතනය ලෙස, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද නියෝගයක් අනුව ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන අරමුණ වනුයේ ජාත්‍යන්තර නිර්දේශ හා ප්‍රමිතීන්ට අනුව ශ්‍රී ලංකාව තුළ මුදල් විශුද්ධිකරණය හා සම්බන්ධ මුදල් වංචා, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම, මූල්‍ය සහ වෙනත් මූල්‍ය අපරාධ මැඩපැවැත්වීමට කටයුතු කිරීම වේ.

මේ සඳහා 2016 ජනවාරි මස 06 වන දින පැවැත්වූ ශ්‍රී ලංකා අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී විශේෂ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම මැඩලීම සඳහා වන ජාතික ප්‍රතිපත්තියද සම්මත කර ඇත. මෙය සෛද්ධාන්තික ලෙස හා ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කිරීමේ ගැටලු හා අසම්පූර්ණකම් රාශියකින් යුක්ත වන අතර යෝජිත ක්‍රියාමාර්ග බොහොමයක්ම දිගුකාලීන නොවන නිසා නව ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව පැන නැගී ඇත. තවද, නූතන තාක්ෂණික මෙවලම්වලින් හා නව ක්‍රමෝපායන් හඳුන්වාදීම් මගින් දියුණුවන මුදල් හුවමාරු ක්‍රම නිසා ඇතිවන දැඩි අවදානම නිසා මුදල් විශුද්ධිකරණය පිළිබඳ මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් නවතම නිර්දේශයන් 40 ක් හඳුන්වා දී ඇත. ඒ පිළිබඳ සලකා බලා වර්තමාන අවශ්‍යතාවට අනුව වෘත්තීය මට්ටමේ නව ජාතික උපායමාර්ගික ප්‍රතිපත්තියක් (National Strategic Policy) සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් (National Policy Framework) යෝජනා කළ හැක. මේ නිසා පෙර පැවති ක්‍රමවල බොහෝමයක් අඩු පාඩු අවම කර ගැනීමට හැකි වනු ඇත.

ඒ අනුව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩලීමේ නව ක්‍රමෝපායන ප්‍රතිපත්තිය ප්‍රධාන කොටස් තුනකට බෙදා දැක්විය හැක.

අ ප්‍රතිපත්ති ඇතිකිරීම, මනා සම්බන්ධීකරණය හා සහයෝගීතාවන් උපයෝගී කරගනිමින් මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ හා ජන සංහාරක අවි ආයුධ නිපදවීමෙන් ඇති වන්නා වූ අවදානම අවම කර ගැනීම

ආ මූල්‍ය ආයතන හා අනෙකුත් ආයතන මගින් ත්‍රස්තවාදයට උපකාරී වන අපරාධ ක්‍රියාකාරකම් අනාවරණය කර එය මැඩපැවැත්වීම සඳහා එම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තා කිරීම

ඇ මුදල් විශුද්ධිකරණය සඳහා වූ තර්ජනාත්මක ක්‍රියාවලීන් අනාවරණය කර එය ව්‍යර්ථ කිරීමත් හා නීති විරෝධී ක්‍රියාවන්හි යෙදී සිටි අපරාධකරුවන් හට සම්බාධක යොදමින් නිසි දණ්ඩනයන් ලබාදීමත් නීති විරෝධී මුදල් භාවිතයෙන් තොරකිරීම - ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාවන් අනාවරණය කර ව්‍යර්ථ කිරීම,

අපරාධකරුවන් හට උරුම වත්කම් අහිමි කිරීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ යෙදී සිටින අපරාධකරුවන් හට සම්බාධක යොදමින් නිසි දණ්ඩනයන් ලබා දීම මගින් ත්‍රස්ත ක්‍රියාකාරකම් වළකාලීමට දායක වීම.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා යොදා ගත හැකි යෝජනා ඉදිරිපත් කෙරෙනු ලබන "මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික උපායමාර්ගික ප්‍රතිපත්තිය" ඇමුණුම 1හි  දැක්වේ.

ඉහත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත ජාතික ප්‍රතිපත්ති රාමුව සත්වැදෑරුම් ප්‍රතිපත්ති රාමුවක් වේ. (ඇමුණුම II)

i. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති හා සම්බන්ධීකරණය
ii. මුදල් විශුද්ධිකරණයට ලක් කළ මුදල් රාජසන්තක කිරීම
iii. ත්‍රස්තවාදයට මූල්‍ය පහසුකම් සැපයීම හා ප්‍රගුණනය කිරීම වැළැක්වීම
iv. වළකාලීමේ ක්‍රියාමාර්ග
v. නෛතික පුද්ගලයින්ගේ හා ක්‍රියාකාරකම් පිළිබඳ පාරදෘෂ්‍යතාව හා අර්ථලාභී උරුමය
vi. බලධාරීන්ගේ හා අනෙකුත් සංස්ථායික ක්‍රියාමාර්ග සඳහා වූ බලතල හා වගකීම්
vii. ජාත්‍යන්තර සහයෝගීතාව

**ජාතික මට්ටමේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩලීම සඳහා විවිධ අංශවල ක්‍රියාකාරීත්වය**

ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය මඟින් තම ගනුදෙනුකරුවන් හඳුනාගැනීම සඳහා උපකාරී වන නිශ්චිත මූලික තොරතුරු ලබා ගන්නා ලෙස විශේෂයෙන් පහත දැක්වෙන ආයතනවලට උපදෙස් ලබා දී ඇත.

- බලපත්‍රලාභී බැංකු
- බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
- රක්ෂණ සමාගම්
- කොළඹ කොටස් වෙළෙඳපොළ තැරැව්කාර සමාගම්
- බලපත්‍රලාභී මුදල් මාරු කරන්නන්

යම් පුද්ගලයෙකු ඉහත සඳහන් ආයතනවල ගනුදෙනුකරුවෙක් නම් හැකි හැමවිටම එම ආයතනවලට ඔහුව හඳුනාගැනීම සඳහා අවශ්‍ය වන ඔහුගේ අනන්‍යතාව නිවැරදිව එම ආයතනවලට ලබා දීම අත්‍යවශ්‍ය කරුණකි. තවද ඔවුනට අවශ්‍ය ගනුදෙනුකරු පිළිබඳව වෙනයම් තොරතුරක් එම ගනුදෙනුකරු සතුව ඇත්නම් එයත් එම කරුණු සනාථ කිරීම සඳහා සාක්ෂි ලේඛනත් එම ආයතනවලට ලබා දී තම අනන්‍යතාව නිශ්චිතවම සැක හැර සනාථ කිරීමට කටයුතු කිරීම ගනුදෙනුකරුගේ නීත්‍යානුකූල වගකීමක් වනු ඇත.

මේ සඳහා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය මඟින් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ රීති නිකුත් කර ඇත. එය 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යොගයෙන් ක්‍රියා කිරීමේ) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ රීති 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන අදාළ වන මූල්‍ය ආයතනය යනුවෙන් සඳහන් කරනු ලබන මූල්‍ය ව්‍යාපාරයේ නියැලී සිටින ආයතනවලට අදාළ වේ.

ඒ අනුව, සෑම මූල්‍ය ආයතනයක් විසින් ම, තම ගනුදෙනුකරුවන් වෙතින් යොමුවන මුදල් විශුද්ධිකරණ අවදනම් සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදනම් හඳුනාගැනීමේ, තක්සේරු කිරීමේ හා කළමනාකරණය කිරීමේ කාර්යය ඉටු කිරීම සඳහා අවදනම මත පදනම් වූ පිවිසුම (Risk Base Approach) මත පිහිටා, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් නොකඩවා ක්‍රියා කිරීම කළ යුතුය.

ඒ අනුව, එම ආයතනවලින්. ගනුදෙනුකරුවන් පිළිබඳ පහත දැක්වෙන මූලික තොරතුරුද ලබාගනු ඇත.

- හඳුනා ගැනීමේ ලේඛනයන් හි පිටපත්

  (ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය)
- ස්ථිර ලිපිනය/ව්‍යාපාරික ලිපිනය
- රැකියාවේ හා සේවා යෝජකයාගේ නම්/ව්‍යාපාරය
- ව්‍යාපාරික නම් ව්‍යාපාරයේ ස්වභාවය සහ අපේක්ෂිත ආදායම
- ගිණුම ඇරඹීමට හේතුව

මූල්‍ය ගනුදෙනුවල දී ගනුදෙනුකරුවන් හඳුනාගැනීම සහ ඔවුන්ගේ වෙනත් මූලික තොරතුරු එක්රැස්

කිරීම ලෝකයේ සෑම රටක් ම පිළිගත් ක්‍රමවේදයකි. එබැවින් මේ පිළිබඳව සෑම ගනුදෙනුකරුවෙකුගේම අවධානය යොමුවීම හා එයට දක්වන සහයෝගය මත මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මර්දනය කිරීමේ සාර්ථකත්වය රඳා පවතී.

අපරාධකරුවන් හා ත්‍රස්තවාදීන් විසින් නීතියේ ඇති අඩුලුහුඬුකම් සොයමින් ඒ අතරින් රිංගා යාමට උත්සාහ දරන බැවින් හැකි සෑම විටම ගනුදෙනුකරුගේ අනන්‍යතාව සාක්ෂාත් කිරීමට උනන්දු වන්න. උදාහරණයක් ලෙස ණයපත් (Credit Cards) වලට ලබාගන්නා අතිරේකපත් සඳහා ද තෙවන පාර්ශ්වය පිළිබඳ සියලු තොරතුරු අදාළ ආයතනයට ලබා දිය යුතු අතර එමගින් ව්‍යාජ ණයපත් හා අනන්‍යතාවන්ගේ අවභාවිතයන් අඩුවනු ඇත.

ව්‍යාපාරික ගිණුම්වල දී ව්‍යාපාරයේ සාමාන්‍ය පොදු හඳුනා ගැනීමේ ලියකියවිලි ලබාදිය යුතුවේ. අවශ්‍ය වන අවස්ථාවල දී අධ්‍යක්ෂවරුන් හා වෙනත් සම්බන්ධිත කණ්ඩායම් එනම්, මූලික කොටස්හිමියන්, ප්‍රතිලාභ හිමිකරුවන් සහ බලයලත් සහතික කරන්නන්ගේ ද තොරතුරු සමඟ හඳුනා ගැනීමේ පත්‍රිකා සහ පදිංචිය සනාථ කිරීමේ ලේඛන යනාදිය ලබාදිය යුතුය.

### මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්වීමට අදාළව ගනුදෙනුකරු සතු කාර්යභාරය -

ශ්‍රී ලංකාව තුළ බලයලත් බැංකු හා වෙනත් මූල්‍ය ආයතනවලට හා ඒවායේ සිටින ගනුදෙනුකරුවන්ට මෙම මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්වීමේ ඉතා විශාල කාර්යභාරයක් පැවරී ඇතිවාක් මෙන් ම එමගින් ඉතා වටිනා සේවාවක් ද ඉටු කළ හැකි වේ. දැනටමත් ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයෙන් දැනුම් දී ඇති පරිදි බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවලට තම ගනුදෙනුකරුවන් පිළිබඳව කාලීනව වැඩිදියුණු කළ නිසි අවධානයකින් (Enhanced Due Diligence) යුක්තව සිටීමෙන් බොහොමයක් නීතිමය නොවන ක්‍රියා මගින් හුවමාරු වන අරමුදල් හඳුනා ගත හැකි වේ. ගනුදෙනුකරුවන්ට ද තම මූල්‍ය ආයතනවලින් සිදුකරනු ලබන කාලීන විමසුම්වලට සහයෝගය දැක්වීම මගින් හා ඔවුනට අවශ්‍ය අනෙකුත් තොරතුරු ලබාදීමෙන් මේ සඳහා දායක විය හැකිය.

මූල්‍ය ආයතනයක ගනුදෙනුකරුවෙකු ලෙස, ගනුදෙනුකරු තමා පිළිබඳ තොරතුරු තම ගිණුම පවත්නා මූල්‍ය ආයතනය වෙත ලබාදිය යුතු අතර එම තොරතුරු අතර ගනුදෙනුකරුගේ රැකියාව හෝ ව්‍යාපාරය පිළිබඳ තොරතුරු, ගනුදෙනුකරු ගිණුම ඇරඹීමට හේතු වූ කරුණු, අරමුදල් ලබාගැනීමේ මූලාශ්‍රයන් හා පවතින වත්කම් ගිණුමේ පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන මුදල් ප්‍රමාණය, සාමාන්‍ය පිරිවැටුම හා අනෙකුත් අදාළ වන මූලික තොරතුරු ප්‍රධාන තැනක් ගනී. ගනුදෙනුකරුගෙන් ලබාගන්නා මෙම තොරතුරු මූල්‍ය ආයතනය ඉතා දැඩි ලෙස සුරක්ෂිතව, රහසිගතව තබාගනු ලබන අතර මෙම දත්ත යාවත්කාලීනව පවත්වා ගනු ඇත. මෙසේ ලබා ගන්නා තොරතුරු 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 9 වන වගන්තිය අනුව, මූල්‍ය ආයතන විසින් වෙනත් බාහිර පාර්ශ්ව වෙත හෙළිදරව් නොකිරීම මගින් එහි රහස්‍යභාවය නිතැතින්ම සුරකිනු ඇත.

ශ්‍රී ලංකාව තුළ මූල්‍ය විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්වීමෙහිලා ඉතා විශාල කාර්යභාරයක් ගනුදෙනුකරුටත්, ඔහුගේ මූල්‍ය ආයතනයටත් ඇති බැවින් ඒ වෙනුවෙන් ඔහුගේ උපරිම දායකත්වය ලබා දී මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමෙන් තොර වූ ශ්‍රී ලංකාවක් බිහිකිරීමට හැකි වනු ඇත. එය ගනුදෙනුකරුවන්ගේ හා මූල්‍ය ආයතනවලත් යුතුකම හා වගකීම වන්නේ ය.

ආශ්‍රිත ග්‍රන්ථ හා වෙබ් අඩවි :


- The Financial Action Task Force -FATF (February 2012), Recommendations 2012, Available at: http://www.fatf-gafi.org
- The Financial Action Task Force (FATF) , Methodology to assess the effectiveness of AML/ CFT systems, 2013
- The Financial Action Task Force (FATF) , Procedures for the FATF Fourth Round of AML/CFT Mutual Evaluations
- The International Bank for Reconstruction and Development/The World Bank/
- The World Bank & The International Monetary Fund, Reference Guide to Anti-Money Laundering and Combating the Financing of Terrorism (2006), Available at: https://www.imf.org/external/np/ leg/amlcft/eng/
- Financial Intelligence Unit of Sri Lanka, Annual Reports (2012, 2013), Central Bank Press
- Financial Intelligence Unit of Sri Lanka, Press Notice (2012), Notice to the Customers of Financial Institutions, Available at: http://fiusrilanka.gov.lk/

**ඇමුණුම I**

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා යොදා ගත හැකි යෝජනා කරනු ලබන,

### මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික උපායමාර්ගික ප්‍රතිපත්තිය

**අරමුණ**

මුදල් විශුද්ධිකරණයෙන්, ත්‍රස්තවාදයට මුදල් සැපයීමෙන් හා ජන සංහාරක අවි ආයුධ නිපදවීමෙන් ඇති වන්නාවූ හා මුහුණ දීමට සිදුවන්නා වූ තර්ජනාත්මක ක්‍රියාවලීන්ගෙන් මූල්‍ය පද්ධතීන් හා සමස්ත ආර්ථිකය ආරක්ෂා කිරීම හා මෙමගින් මූල්‍ය අංශයේ අඛණ්ඩතාව ශක්තිමත් කිරීම සඳහා එහි ආරක්ෂාව හා ස්ථාවරත්වය ඇති කරගැනීම.

අ ප්‍රතිපත්ති ඇතිකිරීම, මනා සම්බන්ධීකරණය හා සහයෝගීතාවන් උපයෝගී කරගනිමින් මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ හා ජන සංහාරක අවි ආයුධ නිපදවීමෙන් ඇති වන්නා වූ අවදානම අවම කර ගැනීම

1 මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම හා අදාළ වන අවස්ථාවන්හිදී මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා ජන සංහාරක අවි ආයුධ නිපදවීම වැළැක්වීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති, නීති රීති ඇති කිරීමෙන් හා දේශීය වශයෙන් මනා සම්බන්ධීකරණයක් ඇති කර ඒවා මැඩ පැවැත්වීම

2 ජාත්‍යන්තර සහයෝගීතාව ඇති කර ගැනීම සඳහා අපරාධකරුවන් හා ඔවුන් සතු වත්කම් අනාවරණ කර දැඩි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය තොරතුරු, මූල්‍ය බුද්ධිමය හා සාක්ෂි හුවමාරු කරමින් උපකාරී වීම

ආ මූල්‍ය ආයතන හා අනෙකුත් ආයතන මගින් ත්‍රස්තවාදයට උපකාරී වන අපරාධ ක්‍රියාකාරකම් අනාවරණ කර එය මැඩපැවැත්වීම සඳහා එම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තා කිරීම

1 මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමට සරිලන අවශ්‍යතාවන් සඳහා වූ අනුකූලතාවයේ රඳවා ගැනීමට අධීක්ෂකයා විසින් එහි ඇති අවදානම් තත්ත්වයන් අවබෝධ කරගනිමින්, මූල්‍ය ආයතන හා නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් (Designated Non-Financial Business and Professions) නිසිලෙස අධීක්ෂණය, උපදේශනය හා නියාමනය කිරීම

2 මූල්‍ය ආයතන හා නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වූ වළකා ගත යුතු ක්‍රියාමාර්ග, අවදානම් තත්ත්වයන් අවබෝධ කරගැනීම හා එම දැනුම උපයෝගී කර ගැනීමෙන් සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම

3 මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා නෛතික පුද්ගලයින් හා නෛතික වැඩපිළිවෙළ උපයෝගී කර ගනු ලබන ක්‍රමෝපායයන් වළකාලීමට විධිවිධාන යෙදීම හා ඔවුන්ගේ ප්‍රතිලාභී හිමිකම පිළිබඳ තොරතුරු නිසි බලධාරීන්ට බාධාවකින් තොරව ලබා ගැනීමට කටයුතු කිරීම

ඇ මුදල් විශුද්ධිකරණය සඳහා වූ තර්ජනාත්මක ක්‍රියාවලීන් අනාවරණය කර එය ව්‍යර්ථ කිරීමත් හා නීතිවිරෝධී ක්‍රියාවන්හි යෙදී සිටි අපරාධකරුවන් හට සම්බාධක යොදමින් නිසි දණ්ඩනයන් ලබාදීමත්. නීති විරෝධී මුදල් භාවිතයෙන් තොරකිරීම - ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාවන් අනාවරණය කර ව්‍යර්ථ කිරීම, අපරාධකරුවන් හට උරුම වත්කම් අහිමි කිරීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ යෙදී සිටින අපරාධකරුවන් හට සම්බාධක යොදමින් නිසි දණ්ඩනයන් ලබාදීම මගින් ත්‍රස්ත ක්‍රියාකාරකම් වළකාලීමට දායක වීම

1 මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ විමර්ශන සඳහා මූල්‍ය බුද්ධිය සහ අනෙකුත් තොරතුරු බලධාරීන් විසින් නිසිලෙස උපයෝගී කර ගැනීම

2 මුදල් විශුද්ධිකරණය සම්බන්ධ අපරාධ ක්‍රියාවන් විමර්ශනය කර එය බලාත්මක කිරීම සඳහා ප්‍රමාණාත්මක සහ එවැනි දෑ නොකිරීමට හේතුවන සම්බාධක ඇතුළත් කිරීම මගින් වරදකරුවන් හට ඔවුන් විසින් කරනු ලබන අපරාධ ක්‍රියාවන් සඳහා සමානුපාතික දණ්ඩනයන් ලබා දීමට නීතිමය පියවරයන් ගැනීම

3 අපරාධ ක්‍රියාවන්හි සම්බන්ධ දේපළ හා මූල්‍ය වත්කම් රාජසන්තක කිරීම

4 ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ අපරාධ ක්‍රියාවන් විමර්ශනය කර වරදකරුවන් හට ඔවුන් විසින් කරනු ලබන අපරාධ ක්‍රියාවන් සඳහා ඵලදායි වූ සමානුපාතික හේතු සාධක සහිත දණ්ඩනයන් ලබා දීමට හෝ සම්බාධක පැනවීමට නීතිමය පියවර ගැනීම

5 ත්‍රස්තවාදී ක්‍රියා සඳහා හා ත්‍රස්තවාදී සංවිධානයන්ට මුදල් සැපයීම, මුදල් රැස් කිරීම, මුදල් ගෙන්වා ගැනීම හා ත්‍රස්තවාදය සඳහා මූල්‍ය සහාය ලබා ගැනීමට රාජ්‍ය නොවන ආයතන හා ලාභ නොලබන ආයතන උපයෝගී කර ගැනීම වළකාලීම

6 ජන සංහාරක අවි ආයුධ නිපදවීමේ යෙදී සිටින පුද්ගලයින් හා ආයතන වෙනුවෙන් මුදල් රැස් කිරීම, මුදල් භාවිතය හා මුදල් ගෙන්වා ගැනීම එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවලියට අනුකූලව වළකාලීම

ඇමුණුම II

**මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා යොදා ගත හැකි වූ යෝජිත ජාතික ප්‍රතිපත්ති රාමුව**

අ **මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයිම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති හා සම්බන්ධීකරණ කටයුතු ඉටුකිරිම**

1 අවදානම තක්සේරු කිරීම හා අවදානම පදනම් කරගත් ක්‍රමවේදයක් හඳුන්වා දීම

2 ඒ සඳහා ජාතික සහයෝගීතාව ලබා ගැනීම හා සම්බන්ධීකරණය

ආ **මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා එම දේපළ හා මුදල් රාජසන්තක කිරීම**

1 මුදල් විශුද්ධිකරණය සම්බන්ධ වැරදි හඳුනා ගැනීම

2 දේපළ හා මුදල් රාජසන්තක කිරීම් හා තාවකාලික ක්‍රියාමාර්ග හඳුන්වාදීම

ඇ **ත්‍රස්තවාදයට හා ජන සංහාරක අවි ආයුධ නිපදවීමට මූල්‍ය පහසුකම් සැපයීම වැළැක්වීම**

1 ත්‍රස්තවාදයට මුදල් සපයන වැරදිකරුවන් හඳුනා ගැනීම

2 ත්‍රස්තවාදයට හා ත්‍රස්තවාදය සඳහා මූල්‍ය පහසුකම් සපයන්නන් සඳහා මූල්‍ය සම්බාධක පැනවීම

3 ජන සංහාරක අවි ආයුධ නිපදවන්නන් සඳහා මූල්‍ය සම්බාධක පැනවීම

4 ත්‍රස්තවාදය සඳහා දායක වන රාජ්‍ය නොවන ආයතන හා ලාභ නොලබන ආයතන හඳුනා ගැනීම

ඈ **මැඩ පැවැත්වීමේ/ නිවාරණ ක්‍රියාමාර්ග ඉටුකිරිම**

1 මූල්‍ය ආයතනවල රහස්‍යභාවය පිළිබඳ නීති ක්‍රියාත්මක කිරීම

2 ගනුදෙනුකරු පිළිබඳ සුපරීක්ෂාකාරී වී ඔවුන් හඳුනා ගැනීම

3 ගනුදෙනුකරු පිළිබඳ වාර්තාගත කිරීම

- පහත සඳහන් විශේෂ ගනුදෙනුකරුවන් හා ඔවුනගේ ක්‍රියාවන් සඳහා වූ අතිරේක ක්‍රියාමාර්ග ගැනීම.

4 දේශපාලනික වශයෙන් අනාවෘත වූ පුද්ගලයින්

5 අනුරූපක බැංකු ව්‍යාපාර

6 මුදල් හා අගයන් හුවමාරු කිරීමේ සේවාව

7 නව තාක්ෂණය භාවිතය

8 විද්‍යුත් මුදල් හුවමාරු ක්‍රම

- විශ්වසනීයත්වය, පාලනය හා මූල්‍ය කණ්ඩායම් පිළිබඳ දැඩි අවධානය යොමු කිරීම

9 තෙවන පාර්ශ්වයන් පිළිබඳ වූ විශ්වාසවන්තබව පවත්වා ගැනීමේ අවදානම

10 අභ්‍යන්තර පාලනය, විදේශ ශාඛා හා අනුබද්ධිත සමාගම්වල පවත්නා අවදානම

11 ඉහළ අවදානමක් ඇති රටවල් සමඟ ගනුදෙනු කිරීම

- සැකකටයුතු ගනුදෙනු පිළිබඳ වාර්තා කිරීම

12 සැකකටයුතු ගනුදෙනු පිළිබඳ වාර්තා කිරීම

13 අභ්‍යන්තර තොරතුරු නිරාවරණය හා රහසිගතභාවය පවත්වා ගැනීම.

- නම්කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් පිළිබඳ

14 මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් - ගනුදෙනුකරු පිළිබඳ සුපරීක්ෂාකාරී වීම

15 මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් - අනෙකුත් ක්‍රියාමාර්ග

**ඉ නෛතික පුද්ගලයින්ගේ හා විධිවිධාන පිළිබඳ පාරදෘෂ්‍යතාව හා අර්ථලාභී උරුමය**

1 නෛතික පුද්ගලයින් පිළිබඳ පාරදෘෂ්‍යතාව හා අර්ථලාභී උරුමය

2 නෛතික විධිවිධාන පිළිබඳ පාරදෘෂ්‍යතාව හා අර්ථලාභී උරුමය

**ඊ නිසි බලධාරීන්ගේ හා අනෙකුත් සංස්ථායික ක්‍රියාමාර්ග සඳහා වූ බලතල හා වගකීම්**

- නියෝග හා අධීක්ෂණය

1 මූල්‍ය ආයතන පිළිබඳ නියෝග ලබාදීම හා අධීක්ෂණය

2 අධීක්ෂකයන්ගේ බලතල නිර්ණය

3 මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් පිළිබඳ නියෝග හා අධීක්ෂණ

- නීති බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම

4 මූල්‍ය බුද්ධි ඒකක පිහිටුවීම හා මනා ක්‍රියාකාරිත්වය

5 නීති බලාත්මක කිරීම හා විමර්ශන බලධාරීන්ගේ වගකීම්

6 නීති බලාත්මක කිරීමේ හා විමර්ශන බලධාරීන්ගේ බලතල

7 පණිවුඩකරුවන් මගින් මුදල් ගනුදෙනු සිදු කිරීම

- පොදු අවශ්‍යතාවන්

8 සංඛ්‍යාලේඛන පවත්වා ගැනීම

9 මාර්ගෝපදේශනය සහ ප්‍රතිපෝෂණය

- සම්බාධක

10 සම්බාධක පැනවීම හා පසුවිපරම

**උ ජාත්‍යන්තර සහයෝගීතා වැඩි දියුණු කිරීම**

1 ජාත්‍යන්තර උපාංග හා මෙවලම් භාවිතය

2 අන්‍යොන්‍ය නීතිමය සහාය ලබා ගැනීම

3 අන්‍යොන්‍ය නීතිමය සහාය යටතේ වත්කම් - අත්හිටුවීම හා රාජසන්තක කිරීම

4 සිර භාරයට ගැනීම

5 අනෙකුත් ආකාරයේ ජාත්‍යන්තර සහයෝගීතා වර්ධනය

---

**නිවැරදි කිරීම**

“සටහන 2017 ජූලි-අගෝස්තු” කලාපයේ පළවූ ලිපි සැපයූ ලේඛිකාවන් දෙදෙනකුගේ තනතුරු නාම වැරදි ලෙස මුද්‍රණය වී තිබිණ. ඒවා පහත සඳහන් ආකාරයට නිවැරදි විය යුතු ය.

**"මූලික උද්ධමනය, එහි වැදගත්කම සහ ගණනය කිරීමේ විවිධ ක්‍රම"**
ඊ. එච්. ලියනගේ
ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥ
ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

**"ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ආදායම් දරිද්‍රතා දර්ශකය සංසන්දනය**
ඩබ්. එච්. අයි. මධුවන්ති
කළමනාකරණ අභ්‍යාසලාභී
දේශීය කටයුතු දෙපාර්තමේන්තුව

ඒ නිසා යම් අපහසුතාවක් වී නම් ඒ පිළිබඳ ව අපගේ කනගාටුව පළ කරමු.

**- සංස්කාරක**

# ගෙවුම් තුලන ලේඛනය (BPM6)

**කීර්ති විජේතුංග**
අධ්‍යක්ෂ, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව

### ගෙවුම් තුලනය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත ගෙවුම් තුලන ක්‍රමවේදය පිළිබඳ අත්පොතෙහි හයවන (BPM6) සංස්කරණයට අනුව, ගෙවුම් තුලන දත්ත පිළිබඳ සමීක්ෂණය කිරීම, දත්ත රැස්කිරීම හා ඒවා වාර්තා කිරීමේ ක්‍රමවේදයට අමතරව බොහෝ නිර්වචන සහ මූලධර්ම සම්බන්ධයෙන් ද වෙනස්කම් රැසකට භාජන වී ඇත. ගෙවුම් තුලන ක්‍රමවේදයෙහි පස්වන සංස්කරණය හඳුන්වාදීමෙන් පසුව ගෝලීය ආර්ථිකයෙහි ඇති වූ වෙනස්කම් සමඟ බිහි වූ නව ජාත්‍යන්තර ගනුදෙනු සහ බාහිර අංශයේ දත්ත සම්පාදනය කිරීමේ ක්‍රමවේදයෙහි පැවති ගැටලු BPM6 මඟින් නිරාකරණය කර ඇත. හයවන සංස්කරණය මඟින් ප්‍රධාන වශයෙන් ගෙවුම් තුලන ලේඛනයට අමතරව අන්තර්ජාතික ආයෝජන තත්ත්වය හා මූල්‍ය වත්කම් හා වගකීම්වල අනෙකුත් වෙනස්වීම් ගිණුම් යනුවෙන් නව ගිණුම් දෙකක්ද හඳුන්වා දී ඇත. ගෙවුම් තුලන ක්‍රමවේදය පිළිබඳ මෙම ලිපිය BPM6 ට අනුව ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් ක්‍රියාවට නංවා ඇති ඉහත දක්වන ලද වෙනස්කම් පදනම් කරගෙන සකස්කරන ලද්දකි.

> **ගෙවුම් තුලන නිර්වචනය**
>
> කිසියම් ආර්ථිකයක් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ දී නේවාසිකයින් සහ අනේවාසිකයින් අතර සිදු කරනු ලැබූ සියලුම ආර්ථික ගනුදෙනු සාරාංශ කර දක්වන සංඛ්‍යාත්මක ප්‍රකාශනය යි. (BPM6)

### ගෙවුම් තුලන ලේඛනයෙහි සංයුතිය

BPM6 වලට අනුව ගෙවුම් තුලන ලේඛනය ප්‍රධාන වශයෙන් ජංගම සහ ප්‍රාග්ධන ගිණුම සහ මූල්‍ය ගිණුම වශයෙන් ප්‍රධාන ගිණුම් දෙකකි. ජංගම ගිණුම තවදුරටත් වෙළඳ, සේවා, ප්‍රාථමික ආදායම් හා ද්විතීයික ආදායම් ලෙස උප ගිණුම් හතරක් ද, මූල්‍ය ගිණුම සෘජු ආයෝජන, විවිධ ආයෝජන, මූල්‍ය ව්‍යුත්පන්න, අනෙකුත් ආයෝජන සහ සංචිත වත්කම් ලෙස උප ගිණුම් පහකින් ද සමන්විත වේ. BPM6 වලට අනුව සකස් කරන ලද ගෙවුම් තුලන ලේඛනයෙහි සරලම ඉදිරිපත් කිරීම දත්ත සහිතව සංඛ්‍යා ලේඛන 1 හි දක්වා ඉන් පසුව ඒ ඒ ගිණුම් තුල අන්තර්ගත දෑ විස්තර කෙරේ.

### ද්විත්ව සටහන් ක්‍රමය

ගෙවුම් තුලන දත්ත ඉදිරිපත් කිරීමේ නව ආකෘතියට අනුව ජංගම, සහ ප්‍රාග්ධන ගිණුමේ ලැබීම් සහ ගෙවීම් සටහන් පිළිවෙළින් බැර සහ හර සටහන් වශයෙන් වමේ සිට දකුණු දෙසට තීරු තුළ ද, මූල්‍ය ගිණුමේ ශුද්ධ වත්කම් අත්පත් කරගැනීම් හා ශුද්ධ වගකීම්වල වෙනස් වීම් සටහන් පිළිවෙළින් හර සහ බැර සටහන් වශයෙන් වමේ සිට දකුණු දෙසට තීරු තුළ ද ඇතුළත් කෙරේ. සෑම ගනුදෙනුවක් සඳහාම සමාන හර සහ බැර සටහනක් පවතී. මෙම ක්‍රමය සිරස් ද්විත්ව සටහන් ක්‍රමය (මේ සඳහා සංඛ්‍යාත්මක උදාහරණ කිහිපයක් ලිපිය අවසානයේ දක්වා ඇත) ලෙස හැඳින්වේ. මෙම සිරස් ද්විත්ව සටහන් ක්‍රමයට ගෙවුම් තුලන දත්ත සටහන් තබන බැවින් ජංගම, සහ ප්‍රාග්ධන ගිණුම සහ මූල්‍ය ගිණුමෙහි ශේෂ එකතු කළ විට න්‍යායාත්මකව

අවසාන අගය ශූන්‍ය වේ. නමුත් ප්‍රායෝගිකව දත්ත රැස්කිරීමේ හා වාර්තා කිරීමේ අතපසුවීම් හා මූල්‍ය ගනුදෙනු හා රේගු සටහන් කිරීමේ කාල පරතර වැනි හේතු නිසා ඉහත කී ගිණුම් ශේෂවල එකතුව තුලනය නොවේ. එවිට එම වෙනස වැරදීම් හා අත්හැරීම් ලෙස වෙනම ගිණුමක් යටතේ සටහන් කිරීමෙන් තුලනය කර දක්වයි.

**සංඛ්‍යා සටහන 1: ගෙවුම් තුලන ලේඛනය -2016 රු. මිලියන**

| | ලැබීම් (බැර) | ගෙවීම් (හර) | ශුද්ධ |
|---|---|---|---|
| 1 භාණ්ඩ ගිණුම (අපනයන/ආනයන) | **2,540,049** | **3,442,490** | **-902,442** |
| 2 සේවා ගිණුම (2.1 සිට 2.8 දක්වා) | **1,039,283** | **616,230** | **423,053** |
| 2.1 ප්‍රවාහන | 327,581 | 235,601 | 91,980 |
| 2.2 සංචාරක | 512,373 | 224,451 | 287,922 |
| 2.3 විදුලි සංදේශ, පරිගණක හා තොරතුරු සේවා | 124,934 | 60,721 | 64,213 |
| 2.4 ඉදිකිරීම් | 9,195 | 4,251 | 4,944 |
| 2.5 රක්ෂණ සේවා | 17,619 | 13,014 | 4,605 |
| 2.6 මූල්‍ය සේවා | 36,633 | 58,593 | -21,960 |
| 2.7 වෙනත් ව්‍යාපාරික සේවා | 6,106 | 9,766 | -3,660 |
| 2.8 රජයේ වියදම් | 4,843 | 9,835 | -4,991 |
| 3 ප්‍රාථමික ආදායම් ගිණුම (3.1+3.2) | **17,530** | **334,583** | **-317,053** |
| 3.1 සේවක වැටුප් | 2,291 | 9,692 | -7,401 |
| 3.2 ආයෝජන ආදායම් | 15,239 | 324,891 | -309,652 |
| 4 ද්විතීයික ආදායම් ගිණුම (4.1+4.2) | **1,057,281** | **117,498** | **939,782** |
| 4.1 සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 1,054,489 | 117,489 | 936,990 |
| 4.2 රජය | 2,792 | - | 2,792 |
| 5 ජංගම ගිණුම (1+2+3+4) | **3,614,860** | **3,894,571** | **-279,712** |
| 6 ප්‍රාග්ධන ගිණුම (6.1 + 6.2) | **6,795** | **3,013** | **3,782** |
| 6.1 රජය | 5,185 | - | 5,185 |
| 6.2 පෞද්ගලික ප්‍රාග්ධන සංක්‍රාම | 1,610 | -3,013 | -1,403 |
| 7 ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (5 + 6) | **3,621,654** | **3,897,585** | **-275,930** |
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් (හර) | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් (බැර) | ශුද්ධ මූල්‍ය ගිණුම |
| 8 මූල්‍ය ගිණුම (8.1 + 8.2 + 8.3 + 8.4 + 8.5) | **14,564** | **322,357** | **-307,793** |
| 8.1 සෘජු ආයෝජන | 34,476 | 131,992 | -97,516 |
| 8.2 විවිධ ආයෝජන | -1 | 144,688 | -144,688 |
| 8.3 මූල්‍ය ව්‍යුත්පන්න | - | - | - |
| 8.4 අනෙකුත් ආයෝජන | 45,682 | 45,677 | 5 |
| 8.5 සංචිත වත්කම් | -65,593 | - | -65,593 |
| 9 වැරදීම් හා අත්හැරුම් (7) - (8) | -31,862 | - | -31,862 |
| 10 ගෙවුම් තුලනය (7) + (8) + (9) | **3,575,228** | **3,575,328** | **0.00** |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2016

## 1. ජංගම ගිණුමේ උප ගිණුම්

### 1.1. භාණ්ඩ ගිණුම

භාණ්ඩ ගිණුම, නැවතත් සාමාන්‍ය වෙළඳ භාණ්ඩ, මූල්‍ය නොවන රන් සහ වාණිජමය කටයුතුවලට යටත් භාණ්ඩ වශයෙන් ගිණුම් තුනක් යටතේ බෙදා දැක්වේ.

#### 1.1.1. සාමාන්‍ය වෙළෙඳ භාණ්ඩ ගිණුම

නිෂ්පාදන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස බිහි වූ ආර්ථික හිමිකමේ වෙනසකට භාජනය වන දෘශ්‍ය ආනයන හා අපනයන භාණ්ඩ සම්බන්ධයෙන් නේවාසිකයින් හා අනේවාසිකයින් අතර සිදුවන ගනුදෙනු සාමාන්‍ය වෙළඳ භාණ්ඩ ගිණුමෙහි ඇතුළත් කෙරේ.

#### 1.1.2. මූල්‍ය නොවන රත්‍රන් ගිණුම

ස්වර්ණාභරණ නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කිරීමට ගන්නා රත්‍රන් ආනයන හා අපනයන සම්බන්ධයෙන් නේවාසිකයින් හා අනේවාසිකයින් අතර සිදුවන ගනුදෙනු මූල්‍ය නොවන රත්‍රන් ගිණුමට ඇතුළත් කෙරේ. කෙසේ වුව ද, රත්‍රන්වලින් නිම කළ ස්වර්ණාභරණ ඇතුළත් කරනු ලබන්නේ සාමාන්‍ය වෙළෙඳ භාණ්ඩ ගිණුමෙහි ය.

#### 1.1.3. වාණිජමය කටයුතුවලට අයත් භාණ්ඩ ගිණුම

වාණිජමය කටයුතුවලට අයත් භාණ්ඩ ලෙස හඳුන්වන්නේ නේවාසිකයින් විසින් එක් එක් ආර්ථිකයන්ගෙන් භාණ්ඩ මිලදී ගෙන ඒවා තම ආර්ථිකය හරහා නොගොස් තවත් ආර්ථිකයක අනේවාසිකයෙකු හට අලෙවි කරන භාණ්ඩ යි. මෙම උප ගිණුම ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන ලේඛනයෙහි දක්නට නොමැත.

### 1.2. සේවා ගිණුම

නිෂ්පාදන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයකින් බිහි වූ අදෘශ්‍ය සේවා ආනයන හා අපනයන වන ප්‍රවාහන සේවා (මුහුදු/ ගුවන්), සංචාරක, ඉදිකිරීම්, රක්ෂණ හා විශ්‍රාම, මූල්‍ය සේවා, විදුලි සංදේශ හා පරිගණක සේවා, අනෙකුත් ව්‍යාපාරික සේවා සහ වෙනත් තැනක සඳහන් නොවන රජයේ සේවා මේ ගිණුමෙහි ඇතුළත් කෙරේ.

**භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය ශුද්ධ අපනයනය ලෙස හඳුන්වයි**

ශුද්ධ අපනයන = භාණ්ඩ ගිණුමේ ශේෂය + සේවා ගිණුමේ ශේෂය

**ශුද්ධ අපනයන ජාතික ආදායම් ගිණුම් හා සම්බන්ධතාව**

දළ දේශීය නිෂ්පාදනය = දළ දේශීය වියදම + භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය (ශුද්ධ අපනයන)

### 1.3. ප්‍රාථමික ආදායම් ගිණුම

නේවාසිකයින්ට නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ දායකත්වය වෙනුවෙන් හෝ මූල්‍ය හා ස්වාභාවික වත්කම් අනේවාසිකයින්ට සැපයීම වෙනුවෙන් කරනු ලබන ගනුදෙනු ප්‍රාථමික ආදායම් යටතට ගැනේ. සේවක වැටුප් (වසරකට වඩා අඩු කාලයක් සඳහා වෙනත් රටවල සේවය කරන්නන්හට ගෙවන දීමනා), සෘජු සහ විවිධ ආයෝජන ආදායම් (සෘජු හා විවිධ ආයෝජන ආදායම් නැවත ආයෝජනය කිරීමේ ආදායම්, පොලී ආදායම් සහ වියදම්), අනෙකුත් ප්‍රාථමික ආදායම් (බදු, කුලී සහ සහනාධාර) සහ සංචිත වත්කම් සම්බන්ධ ගෙවීම් හා ලැබීම් ගනුදෙනු මෙම ගිණුමෙහි ඇතුළත් කෙරේ.

**ශුද්ධ අපනයන ජාතික ආදායම් ගිණුම් හා සම්බන්ධතාව**

දළ ජාතික නිෂ්පාදනය = දළ දේශීය නිෂ්පාදනය + ශුද්ධ ප්‍රාථමික ආදායම

හෝ

දළ ජාතික නිෂ්පාදනය = දළ දේශීය වියදම - භාණ්ඩ, සහ සේවා හා ශුද්ධ ප්‍රාථමික ආදායම

### 1.4. ද්විතීයික ආදායම් ගිණුම

නේවාසිකයින් සහ අනේවාසිකයින් අතර සිදුවන වර්තන සංක්‍රාම ගනුදෙනු ද්විතීයික ආදායම් ගිණුමෙහි ඇතුළත් කෙරේ. රජයේ වර්තන සංක්‍රාම සහ පෞද්ගලික ප්‍රේෂණ (විදේශීය රටවල සේවා නියුක්තිකයන් විසින් තම රටට එවනු ලබන මුදල් හෝ භාණ්ඩ) මෙම ගිණුමට ඇතුළත් කෙරේ.

**ජාතික ආදායම් ගිණුම් හා සම්බන්ධතාව**

වැය කළ හැකි දළ ජාතික ආදායම =

දළ ජාතික නිෂ්පාදනය + ශුද්ධ ද්විතීයික ආදායම

හෝ

දළ ජාතික නිෂ්පාදනය = දළ දේශීය වියදම - ජංගම (වර්තන) ගිණුමේ ශේෂය

ජංගම ගිණුම = භාණ්ඩ ගිණුම + සේවා ගිණුම + ප්‍රාථමික ආදායම් ගිණුම + ද්විතීයික ආදායම් ගිණුම

ජංගම ගිණුමේ ලැබීම් (බැර) සහ ගෙවීම් (හර) අතර පරතරය ජංගම ගිණුමේ ශේෂය හෙවත් වර්තන ගිණුමේ ශේෂය යනුවෙන් හැඳින්වේ.

**සංඛ්‍යා සටහන 2: ජංගම ගිණුම**

| අයිතම | | 2016 (රුපියල් බිලියන) | | |
|---|---|---|---|---|
| | | බැර | හර | ශුද්ධ |
| 1. | භාණ්ඩ | 1,500 | 2,826 | -1,326 |
| 2. | සේවා | 1,039 | 616 | 423 |
| 3. | ප්‍රාථමික ආදායම් | 18 | 334 | -316 |
| 4. | ද්විතීයික ආදායම් | 1,057 | 117 | 940 |
| 5. | **ජංගම ගිණුමේ ශේෂය** | **3,614** | **3,893** | **-279** |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2016

## 1.5. ප්‍රාග්ධන ගිණුම

නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන ආයෝජන ප්‍රදාන, ණය කපාහැරීම් සහ ජීවිත රක්ෂණ නොවන ගෙවීම් වැනි ප්‍රාග්ධන සංක්‍රාම (ඒකපාර්ශ්වීය) ලැබීම් හා ගෙවීම් සහ නේවාසිකයින් හා අනේවාසිකයින් අතර සිදුවන නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් අත්පත්කර ගැනීම් හා බැහැරකිරීම් (එනම් තානාපති කාර්යාලයකට ඉඩමක් විකිණීම, බලපත්‍ර, බදු ගිවිසුම්, සන්නම් වැනි දෑ) ප්‍රාග්ධන ගිණුමට ඇතුළත් කෙරේ.

ජංගම සහ ප්‍රාග්ධන ගිණුම = ජංගම ගිණුම + ප්‍රාග්ධන ගිණුම

ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ එකතුව ධන අගයක් ගන්නා විට එය ආර්ථිකයේ ශුද්ධ අතිරික්තයකි / ශුද්ධ ණය සැපයීමකි. මෙම ගිණුම අතිරික්තයක්ව පැවතීම නිසා රටේ විනිමය අනුපාතිකය යහපත්වීම, විදේශීය සංචිත ඉහළ යෑම, ආනයන ඉහළ යෑම හා මුදල් සැපයුම ප්‍රසාරණය වීම වැනි තත්ත්වයන් ඇතිවිය හැකිය.

ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ එකතුව ඍණ අගයක් ගන්නා විට එය ආර්ථිකයේ ශුද්ධ හිඟයකි / ශුද්ධ ණය ගැනීමකි. මෙම ගිණුම හිඟව පැවතීම නිසා විනිමය අනුපාතිකය පිරිහීම, විදේශීය සංචිත පහළ යාම, සංචිතවලින් ආනයන ආවරණය කිරීමේ හැකියාව පහළ යෑම, මුදල් සැපයුම සංකෝචනය වීම වැනි තත්ත්වයන් ඇතිවිය හැකිය.

**සංඛ්‍යා සටහන 3: ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය**

| අයිතම | | 2016 (රු. මිලියන) | | |
|---|---|---|---|---|
| | | බැර | හර | ශුද්ධ |
| 5 | ජංගම ගිණුමේ ශේෂය | 3,614 | 3,893 | -279 |
| 6 | ප්‍රාග්ධන ගිණුම | 6 | 3 | 3 |
| 7 | ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | **3,620** | **3,896** | **-276** |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2016

## 2. මූල්‍ය ගිණුම

නේවාසිකයින් හා අනේවාසිකයින් අතර සිදුවන මූල්‍ය වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් සිදුවන ගනුදෙනු මූල්‍ය ගිණුමෙහි ඇතුළත් කෙරේ. මූල්‍ය ගිණුම මූල්‍ය උපකරණ මත පදනම්ව උප ගිණුම් පහකින් සමන්විත වේ. ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය සංකල්පිත වශයෙන් මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන වන අතර නේවාසිකයින් හා අනේවාසිකයන් අතර සිදුවන ශුද්ධ ණය දීම හෝ ලැබීම මූල්‍යනය වන්නේ කෙසේ දැයි මූල්‍ය ගිණුමෙන් පෙන්නුම් කරයි.

### 2.1. ඍජු ආයෝජන

දේශීය ආයතනයක ඡන්දය ප්‍රකාශ කිරීමට හැකියාව ඇති මූලික කොටස් එකතුවෙන් 10% ක් හෝ ඊට වැඩි හිමිකමක් ඇති අනේවාසික ආයෝජන කොටස් හිමිකම් සහ ණය උපකරණ මේ ගිණුම යටතට ගැනේ.

### 2.2. විවිධ ආයෝජන

සියලුම ණය සුරැකුම්පත් ගනුදෙනුවලට සම්බන්ධ විදේශ මුදල් ප්‍රවාහ, ඡන්ද බලය 10% කට වඩා අඩු හිමිකමක් ඇති විදේශීය ආයෝජන විවිධ ආයෝජන ලෙස සලකා බැලේ.

### 2.3. මූල්‍ය ව්‍යුත්පන්න

අනාගත දිනක දී නිශ්චිත මිලකට හෝ වටිනාකමකට හෝ කිසියම් මූල්‍ය වත්කමක් මිලදී ගැනීමට හෝ විකිණීමට හෝ එකඟවනු ලබන ගිවිසුමක් මූල්‍ය ව්‍යුත්පන්නයක් ලෙස හැඳින්වේ.

උදා - ඉදිරි ගිවිසුම්

### 2.4. අනෙකුත් ආයෝජන

අනෙකුත් කොටස්, මුදල් සහ තැන්පතු, රජයට ලැබෙන ව්‍යාපෘති ණය, වෙළඳ ණය සහ අත්තිකාරම්, රක්ෂණ හා විශ්‍රාම යෝජනාක්‍රම සහ විශේෂ ගැණුම් හිමිකම් මෙම ගිණුමට ඇතුළත් කෙරේ.

### 2.5. සංචිත වත්කම්

ගෙවුම් තුලන අවශ්‍යතාවන් සපුරාගැනීම සඳහා ද, විනිමය අනුපාතිකයේ දැඩි උච්ඡාවචනයන්ගෙන් වළක්වාලීම සඳහා ද, මුදල් ඒකකය සහ ආර්ථිකය පිළිබඳ විශ්වාසය පවත්වාගෙන යෑම සඳහා විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වීමට ද හැකියාව ඇති මහ බැංකුව මඟින් පාලනය වන හා පමාවකින් තොරව ප්‍රයෝජනයට ගතහැකි විදේශීය වත්කම් ලෙස සැලකෙන විදේශ සංචිත වත්කම් එනම් මූල්‍ය රත්‍රන්, විශේෂ ගැණුම් හිමිකම්, අනෙකුත් සංචිත වත්කම් හා ස්ථාවර ආදායම් සුරැකුම්පත් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇති සංචිත වත්කම් මෙම ගිණුම යටතේ අඩංගු කෙරේ.

ජංගම සහ ප්‍රාග්ධන ගිණුමෙහි ශුද්ධ හිඟයක් පවතී නම් එම හිඟය මූල්‍යනය කරන ආකාරය මූල්‍ය ගිණුමෙන් පෙන්නුම් කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වගකීම්වල ශුද්ධ වෙනස්වීම වැඩිවේ.

ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ ශුද්ධ අතිරික්තයක් පවතී නම් මූල්‍ය ගිණුමෙන් පෙන්නුම් කරන්නේ මූල්‍ය වත්කම් අත්පත්කර ගැනීම්හි වැඩිවීමකි. එය අනේවාසිකයන් හට ණය දීමෙන් හෝ සංචිත වත්කම් ඉහළයෑමක් නිසා ඇතිවිය හැකිය.

ගණකාධිකරණයෙහි සම්මත ද්විත්ව සටහන් ක්‍රමයට අනුව මූල්‍ය ගිණුමේ සටහන් තැබීම පහත ආකාරයට සිදුවේ.

අ.) වත්කම්වල ශුද්ධ අත්කරගැනීම් "හර"

ආ.) වගකීම්වල ශුද්ධ වෙනස්වීම් "බැර"

මූල්‍ය ගිණුමේ ගනුදෙනු ඒවායේ ශුද්ධ වටිනාකම පදනම් කරගෙන ගිණුම්ගත කරණ අතර, සෑම මූල්‍ය උපකරණයකටම අදාළ මූල්‍ය ගනුදෙනු හඳුනාගෙන වත්කම් හා වගකීම්වලට අදාළ ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් ශුද්ධ අගයන් බවට පත්කිරීමෙන් පසු ගිණුම්ගත කෙරේ.

### 3. වැරදීම් හා අත්හැරීම්

සමස්ත ආර්ථිකයෙහි විදේශීය ගනුදෙනුවලට අදාළ දත්ත රැස්කිරීමේ අසම්පූර්ණ බව, වැරදි ගිණුම්වල දත්ත සටහන් කිරීම සහ රේගු දත්ත සහ බැංකු දත්තවල කාල පරතර වැනි හේතු නිසා ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන නොවිය හැකිය. එවිට එය සමාන කිරීම සඳහා වැරදීම් හා අත්හැරීම් ගිණුම හරහා ගෙවුම් තුලනය තුලනය කෙරේ.

ගෙවුම් තුලනය = ජංගම හා ප්‍රාග්ධන ගිණුම + මූල්‍ය ගිණුම + වැරදීම් හා අත්හැරීම් = 0

ද්විත්ව සටහන් ක්‍රමයට ගිණුම් තැබීමේ මූලධර්මය නිසා න්‍යායාත්මකව ගෙවුම් තුලනය තුලනය විය යුතු බව අප දැන් දනිමු. නමුත් සංඛ්‍යා 1 හි දක්වා ඇති ගෙවුම් තුලන ලේඛණයෙහි ජංගම හා ප්‍රාග්ධන ගිණුම්වල ශේෂය, මූල්‍ය ගිණුමේ ශේෂය හා වැරදීම් හා අත්හැරීම්වල ශේෂය එකතු කළ විට ගෙවුම් තුලනය තුලනය වේ දැයි බලන්න. එය තුලනය නොවන්නේ නම් තුලනය කරගන්නේ කෙසේදැයි ආභ්‍යාසයක් ලෙස ගණනය කර ගැනීම පාඨකයාට පවරමි.

**සංඛ්‍යා සටහන 4: මූල්‍ය ගිණුම**

| අයිතම | 2016 (රු. බිලියන) | | |
|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ |
| සෘජු ආයෝජන | 34 | 132 | -98 |
| විවිධ ආයෝජන | -1 | 145 | -144 |
| මූල්‍ය ව්‍යුත්පන්න | - | - | - |
| අනෙකුත් ආයෝජන | 46 | 45 | -1 |
| සංචිත වත්කම් | -65 | | -65 |
| මූල්‍ය ගිණුම (ශුද්ධ) (වත්කම් - වගකීම්) | -308 | | |
| වැරදීම් හා අත්හැරීම් | -32 | | |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2016

### 4. සමස්ත ශේෂය

සමස්ත ශේෂය යනු කාල පරිච්ඡේද දෙකක් අතර ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනසයි.

ශුද්ධ ජාත්‍යන්තර සංචිත = (දළ නිළ සංචිත) - (සංචිත වලට අදාළ වගකීම්)

◆ දළ නිල සංචිත = රජයේ සහ මහ බැංකුවේ විදේශීය වත්කම්

**සමස්ත ශේෂය ගණනය කරන්නේ කෙසේ ද?**

සමස්ත ශේෂය = ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනස

= (වර්ෂ අවසානයේ ශුද්ධ සංචිත වත්කම්) - (වර්ෂ ආරම්භයේ ශුද්ධ සංචිත වත්කම්)

**සංඛ්‍යා සටහන 5: සමස්ත ශේෂය**

| අයිතම | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| 1. දළ නිල සංචිත | 8,208 | 7,304 | 6,019 |
| 2. සංචිතවලට අදාළ වගකීම් | 1,691 | 2,275 | 1,490 |
| 3. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (1-2) | 6,517 | 5,029 | 4,529 |
| 4. සමස්ත ශේෂය (වර්ෂ අවසානයේ ශුද්ධ ජාත්‍යන්තර සංචිත - වර්ෂ ආරම්භයේ ශුද්ධ ජාත්‍යන්තර සංචිත) | | -1,488 | -500 |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2016

**5. විදේශ වත්කම් (සංචිත)වල ආනයන ශක්‍යතාව**

ආනයන මාස = (වසර මුල විදේශීය සංචිත ප්‍රමාණය/වසර තුළ අපේක්ෂිත ආනයන වටිනාකම)×12

**6. අන්තර්ජාතික ආයෝජන තත්වය, ගෙවුම් තුලනය හා මූල්‍ය වත්කම් හා වගකීම් ගිණුම්වල සම්බන්ධතාව පහත වගුවෙන් පැහැදිලි වේ.**

| | වසර තුළ ගෙවුම් තුලනය<br>ජංගම ගිණුම<br>ප්‍රාග්ධන ගිණුම | | |
|---|---|---|---|
| වසර මුල අන්තර්ජාතික ආයෝජන තත්ත්වය | මූල්‍ය ගිණුම | මූල්‍ය වත්කම් හා වගකීම්වල අනෙකුත් වෙනස් වීම් ගිණුම<br>■ පරිමාවෙහි වෙනස්වීම්<br>■ ප්‍රතිගණනය කිරීම් (මිල ගනන් හා විදේශ විනිමය) | වසර අග අන්තර්ජාතික ආයෝජන තත්ත්වය |

මෙම ගිණුම් තුනෙහි සංඛ්‍යාත්මක ඉදිරිපත් කිරීම පිටු අංක 22 හි සංඛ්‍යා සටහන 6න් දක්වා ඇත.

සිරස් ද්විත්ව සටහන් ක්‍රමයට ගෙවුම් තුලන දත්ත සටහන් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් මූලධර්ම අනුගමනය කරයි.

| | | |
|---|---|---|
| අ) | ජංගම සහ ප්‍රාග්ධන ගිණුම | බැර සහ හර සටහන් සියල්ලම ධන සංඛ්‍යාවක් ලෙස සටහන් තැබේ. |
| ආ) | මූල්‍ය ගිණුම | වත්කම් හා වගකීම් දෙකෙහිම වැඩිවීමක් නම් ධන සංඛ්‍යාවක් ලෙස ද,<br>වත්කම් හා වගකීම් දෙකෙහිම පහළ යෑමක් නම් සෘණ සංඛ්‍යාවක් ලෙස ද සටහන් කරනු ලැබේ. |

සිරස් ද්විත්ව සටහන් ක්‍රමයට ගෙවුම් තුලන දත්ත සටහන් කිරීම සම්බන්ධයෙන් උදාහරණ පහතින් දක්වේ.

අ. ශ්‍රී ලංකාව එක්සත් ජනපද ඩොලර් 1000 ක් වටිනා මැණික් අපනයනය කිරීම

| ජංගම ගිණුම | බැර | හර |
|---|---|---|
| භාණ්ඩ ගිණුම | 1000 | - |
| මූල්‍ය ගිණුම | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් (හර) | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් (බැර) |
| අනෙකුත් ආයෝජන<br>මුදල් සහ තැන්පතු (කෙටිකාලීන) | 1000 | |

ආ. ශ්‍රී ලංකාව එක්සත් ජනපද ඩොලර් 500 ක් වටිනා ඛණිජ තෙල් ආනයනය කිරීම

| ජංගම ගිණුම | බැර | හර |
|---|---|---|
| භාණ්ඩ ගිණුම | | 500 |
| මූල්‍ය ගිණුම | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් (හර) | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් (බැර) |
| අනෙකුත් ආයෝජන<br>මුදල් සහ තැන්පතු (කෙටිකාලීන) | -500 | |

**සංඛ්‍යා සටහන 6:**



## 2016 වර්ෂයේ ගෙවුම් තුලනය, අන්තර්ජාතික ආයෝජන තතත්වය සහ මූල්‍ය වත්කම් හා වගකීම්වල අනෙකුත් වෙනස් වීමේ ගිණුම් (එ.ජ.ඩො. මිලියන)

| 2016 ජංගම සහ ප්‍රාග්ධන ගිණුම | | | |
|---|---|---|---|
| ශීර්ෂය | බැර | හර | ශුද්ධ |
| **භාණ්ඩ හා සේවා ගිණුම** | **17,448** | **23,659** | **(6,211)** |
| භාණ්ඩ | 10,310 | 19,400 | (9,090) |
| සේවා | 7,138 | 4,259 | 2,879 |
| **ප්‍රාථමික ආදායම්** | **120** | **2,304** | **(2,184)** |
| සේවක වැටුප් | 16 | 67 | (51) |
| ආයෝජන ආදායම් | 105 | 2,238 | 2,133 |
| **ද්විතීයික ආදායම්** | **7,260** | **807** | **6,453** |
| රජය | 19 | - | 19 |
| සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 7,242 | 807 | 6,434 |
| **ජංගම ගිණුමේ ශේෂය** | **24,829** | **26,771** | **(1,942)** |
| **ප්‍රාග්ධන ගිණුම** | **46** | **21** | **26** |
| ප්‍රාග්ධන සංක්‍රාම | 46 | 21 | 26 |
| රජය | 35 | - | 35 |
| පෞද්ගලික ප්‍රාග්ධන සංක්‍රාම | 11 | 21 | (10) |
| **ජංගම සහ ප්‍රාග්ධන ගිණුම** | **24,875** | **26,792** | **(1,917)** |

| | 2016 වර්ෂය ආරම්භයේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය | 2016 මූල්‍ය ගිණුම | | 2016 වර්ෂය අවසානයේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය |
|---|---|---|---|---|
| | | 2016 වර්ෂය තුළ ගනුදෙනු | ප්‍රමාණයෙහි වෙනස්වීම් හා ප්‍රතිගණනය කිරීම් | |
| ශීර්ෂය | | | | |
| වත්කම් | | | | |
| සෘජු ආයෝජන | 817 | 237 | 83 | 1,136 |
| විවිධ ආයෝජන | 0.1 | 0.1 | - | 0.1 |
| මූල්‍ය ව්‍යුත්පන්න | - | - | - | - |
| අනෙකුත් ආයෝජන | 2,614 | 317 | - | 2,931 |
| සංචිත වත්කම් | 7,304 | (472) | (813) | 6,019 |
| **මුළු වත්කම්** | **10,734** | **82** | **(730)** | **10,086** |
| වගකීම් | | | | |
| සෘජු ආයෝජන | 10,022 | 898 | (1,175) | 9,745 |
| විවිධ ආයෝජන | 12,331 | 993 | 448 | 13,772 |
| මූල්‍ය ව්‍යුත්පන්න | - | - | - | - |
| අනෙකුත් ආයෝජන | 31,387 | 308 | (176) | 31,519 |
| **මුළු වගකීම්** | **53,740** | **2,199** | **(904)** | **55,036** |
| **ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය** | **(43,006)** | **(2,117)** | **174** | **(44,949)** |
| වැරදීම් හා අත්හැරීම් | - | **(201)** | | |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2016

ඇ. ජර්මන් සංචාරකයෙකු එක්සත් ජනපද ඩොලර් 100 ක් වටිනා මුදල් නෝට්ටුවක් ලංකා බැංකුවෙන් මාරුකර එයට සමාන රුපියල් ලබාගැනීම

| ජංගම ගිණුම | බැර | හර |
|---|---|---|
| සේවා ගිණුම<br>(සංචාරක) | 100 | |
| මූල්‍ය ගිණුම | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් (හර) | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් (බැර) |
| අනෙකුත් ආයෝජන<br>මුදල් සහ තැන්පතු (කෙටිකාලීන) | 100 | |

ඈ. කටුනායක අධිවේගී මාර්ගය සඳහා ලබාගත් ණයෙන් එක්සත් ජනපද ඩොලර් 2000 ක් වූ ණය වාරිකයක් සහ එක්සත් ජනපද ඩොලර් 200 ක් වූ ණය පොලී ආපසු ගෙවීම

| ජංගම ගිණුම | බැර | හර |
|---|---|---|
| ප්‍රාථමික ආදායම් ගිණුම | | 200 |
| මූල්‍ය ගිණුම | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් (හර) | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් (බැර) |
| අනෙකුත් ආයෝජන<br>මුදල් සහ තැන්පතු (කෙටිකාලීන) | -2200 | |
| ණය | | -2200 |

ඉ. අනේවාසිකයෙකු විසින් මෙරට සමාගමක 10%කට වැඩි තරම් වූ කොටස් එක්සත් ජනපද ඩොලර් 2,500 කට මිලට ගැනීම

| මූල්‍ය ගිණුම | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් (හර) | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් (බැර) |
|---|---|---|
| සෘජු ආයෝජන | | 2500 |
| අනෙකුත් ආයෝජන<br>මුදල් සහ තැන්පතු | 2500 | |

ඊ. අනේවාසිකයෙකු විසින් එක්සත් ජනපද ඩොලර් 2500 ක් වටිනා ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම

| මූල්‍ය ගිණුම | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් (හර) | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් (බැර) |
|---|---|---|
| විවිධ ආයෝජන | | 2500 |
| අනෙකුත් ආයෝජන<br>මුදල් සහ තැන්පතු | 2500 | |

උ. ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් එක්සත් ජනපද ඩොලර් 2500 ක ණයක් ලබා ගැනීම

| මූල්‍ය ගිණුම | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් (හර) | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් (බැර) |
|---|---|---|
| අනෙකුත් ආයෝජන | | 2500 |
| මුදල් සහ තැන්පතු<br>සංචිත වත්කම් | 2500 | |

අභ්‍යාසය: කල්පිත ආර්ථිකයක නේවාසිකයින් හා අනේවාසිකයින් අතර සිදුවුණු පහත සඳහන් ගනුදෙනු (රුපියල් මිලියන) භාවිතා කර ගෙවුම් තුලන ලේඛනය පිළියෙල කරන්න.

| | |
|---|---|
| ආනයන | 200 |
| අපනයන | 150 |
| සේවා ආනයන | 180 |
| සේවා අපනයන | 50 |
| ආයෝජන ආදායම් ලැබීම් | 30 |
| ආයෝජන ආදායම් ගෙවීම් | 110 |
| රජයේ සංක්‍රාම ලැබීම් | 70 |
| පෞද්ගලික ප්‍රාග්ධන සංක්‍රාම ලැබීම් | 85 |
| සෘජු ආයෝජන ලැබීම් | 115 |
| විදේශීය සුරැකුම් පත් මිල දී ගැනීම | 30 |
| ණය ගැනීම් | 75 |
| ණය වාරික ගෙවීම | 40 |
| ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගත් ණය | 65 |

ප්‍රශ්න අංක 1 ට විසඳුම්

කල්පිත ආර්ථිකයක ගෙවුම් තුලන ලේඛනය - රු: මිලියන

| | බැර | හර | ශුද්ධ |
|---|---|---|---|
| භාණ්ඩ ගිණුම | 150 | 200 | -50 |
| සේවා ගිණුම | 50 | 180 | -130 |
| ප්‍රාථමික ආදායම් ගිණුම | 30 | 110 | -80 |
| ද්විතීයික ආදායම් ගිණුම | 70 | - | 70 |
| ජංගම ගිණුම | 300 | 490 | -190 |
| ප්‍රාග්ධන ගිණුම | 85 | - | 85 |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුම | 385 | 490 | -105 |

| මූල්‍ය ගිණුම | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් (හර) | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් (බැර) | ශුද්ධ වෙනස්වීම් |
|---|---|---|---|
| මූල්‍ය ගිණුම | 110 | 215 | -105 |
| සෘජු ආයෝජන | - | 115 | -115 |
| විවිධ ආයෝජන | 30 | - | 30 |
| අනෙකුත් ආයෝජන | | | |
| මුදල් හා තැන්පතු ආයතන | 15 | 100 | -85 |
| (අපනයන ආදායම්) | 150 | | 150 |
| (ආනයන වියදම්) | -200 | | -200 |
| (සේවා අපනයන) | 50 | | 50 |
| (සේවා ආනයන) | -180 | | -180 |
| (ආයෝජන ආදායම්) | 30 | | 30 |
| (ආයෝජන වියදම්) | -110 | | -110 |
| (රජයේ සංක්‍රාම ලැබීම්) | 70 | | 70 |
| (පෞද්ගලික සංක්‍රාම ලැබීම්) | 85 | | 85 |
| (සෘජු ආයෝජන ලැබීම්) | 115 | | 115 |
| (සුරැකුම්පත් මිලදී ගැනීම්) | -30 | | -30 |
| ණය | 75 | | 75 |
| ණය වාරික ගෙවීම් | -40 | -40 | 0 |
| | | 75 | -75 |
| | | 65 | -65 |
| සංචිත වත්කම් | 65 | 0 | 65 |

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.